ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,514 - 2026 නොවැම්බර් මස 06 සිකුරාදා - 2026.11.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

	පිටුව		පිටුව
තනතුරු ඇබෑර්තු	5080	විභාග, විභාග ප්‍රතිඵල ආදිය	5098

සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම් සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 නොවැම්බර් මස 27 දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 නොවැම්බර් මස 13 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

ප්‍රසන්න ජයරත්න,
රජයේ මුද්‍රණාලයාධිපති.

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

5077 - B 82845 - (2026/11)
E - 01

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබුවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම කැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරිහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යටෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම්, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යටෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම් ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසු නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්ට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අනිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත හටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරිහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියක් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මඟින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

විභාග අපේක්ෂකයින් සඳහා නීති සහ උපදෙස්

1976 අංක 19ත් සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ විධිවිධානයන්ට සහ වරින්වර පනවනු ලබන නීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමට සියලු විභාග අපේක්ෂකයින් බැඳී ඇත.

1976 අංක 19 සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ 20 වගන්තිය මගින් විභාග කොමසාරිස් ජනරාල්වරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත කොන්දේසි හා සීමා කිරීම් නියම කරනු ලැබේ.

සියලු විභාග අපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතු අතර මෙම නීති කිසිවක් උල්ලංඝනය කරන විභාග අපේක්ෂකයකුට විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි පහත දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකි ය.

(i) විමර්ශනයට භාජනය වූ මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම
(ii) විමර්ශනයට භාජනය වූ විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සක් කිරීම
(iii) මුළු ජීවිත කාලයටම විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන සියලු විභාගවලට පෙනී සිටීම තහනම් කිරීම
(iv) නිශ්චිත කාලවකවානුවක් සඳහා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවලට පෙනී සිටීම තහනම් කිරීම
(v) අත්හිටවූ විභාග තහනමක් සහිතව ලිපියක් නිකුත් කිරීම
(vi) සහතික පත්‍රය යම්කිසි කාලසීමාවක් තුළ තහනම් කිරීම
(vii) ප්‍රසිද්ධ විභාග පනත යටතේ අපරාධ නඩුවක් පැවරීම සඳහා විභාග අපේක්ෂකයා පොලිසියට භාරදීම හෝ එම ක්‍රියාව සම්බන්ධයෙන් පොලිසියට පැමිණිලි කිරීම
(viii) විභාග අපේක්ෂකයා රජයේ සේවකයකු වන අවස්ථාවකදී විභාග අපේක්ෂකයාගේ ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් අදාළ විභාග අපේක්ෂකයාගේ පත්වීම් බලධාරියා වෙත (විනය ක්‍රියා මාර්ග ගැනීම සඳහා) වාර්තා කිරීම

විභාගයට පෙර හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ මොනයම් අවස්ථාවකදී වුවත් එවැනි විභාග අපේක්ෂකයකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

1. සියලුම විභාග අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී සහ විභාග පරිශ්‍රය තුළදී විභාග ශාලාධිපතිට සහ ඔහුගේ කාර්ය මණ්ඩලයට ද අනෙකුත් විභාග අපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස හැසිරිය යුතුය. එසේම, විභාග අපේක්ෂකයන් විභාග පරිශ්‍රයේ දේපළවලට හෝ විභාග කාර්ය මණ්ඩලයේ පොදුජනයා දේපලවලට කිසිදු අන්දමකින් හෝ අලාභ හානි නොකළ යුතු ය.

2. විභාග අපේක්ෂකයින් විභාගය පවත්වාගෙන යන කාලසීමාව තුළදීත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතිගේ සහ ඔහුගේ කාර්ය මණ්ඩලයේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයට උත්තර ලිවීම ආරම්භ කර පැය භාගයක් ගත වුවාට පසු කිසිදු විභාග අපේක්ෂකයකු විභාග ශාලාවට ඇතුළු කර ගනු නොලැබේ. විභාගය අවසන් වන තුරු ද කිසිම අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටව යාමට ඉඩ ලබා දෙනු නොලැබේ. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට නියමිත වේලාවට සහභාගී වීමට කටයුතු කළ යුතු ය.

4. සෑම විභාග අපේක්ෂකයකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුය. තමන්ට නියම කරන ලද අසුන හැර වෙනත් තැනක අසුන් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදු වේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළතදී විභාග කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතා බස කිරීම හෝ පණිවිඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන් ම තහනම් වේ.

6. විභාග අපේක්ෂකයකුගේ උත්තර පත්‍රය භාරගනු ලබන්නේ අපේක්ෂකයාගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම ලිවීම, උත්තර පත්‍රය භාරගනුගත හැකි වන අයුරින් යම් සලකුණක් හෝ සටහනක් යෙදීම, උත්තර පත්‍රවල අසභ්‍ය හෝ අනවශ්‍ය දේ ලිවීම, උත්තර පත්‍ර සමග මුදල් නෝට්ටු ඇමිණීම සපුරා තහනම් වේ. අන්‍ය විභාග අපේක්ෂකයකුගේ විභාග අංකය තම උත්තර පත්‍රයේ ලිවීම ද වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. භාරගනුගත නොහැකි පරිදි විභාග අංක ලියා ඇති උත්තර පත්‍ර ද ප්‍රතික්ෂේප කිරීම සිදු කෙරෙනු ඇත.

7. තමන් වෙත විභාග ශාලාවේදී සපයන කඩදාසි (විභාගය පැවැත්වෙන දිනයට අදාළව නිරීක්ෂකගේ කෙටි අත්සන හා දිනය යොදා ඇති පිළිතුරු ලිවීමේ කඩදාසි) හැර ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙනත් තැනක හෝ කිසිවක් නොලිවිය යුතු ය. මෙම උපදෙස්වලට පටහැනිව කටයුතු කිරීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සලකනු ලැබේ.

8. විභාග අපේක්ෂකයින් වෙත සපයනු ලබන කඩදාසි හෝ පිළිතුරු ලියන පොතක් හෝ ඉරා දැමීම හෝ පොඩි කිරීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක් ම පැහැදිලිව කපා හැර උත්තර පත්‍රයට ඇමිණීම හෝ විභාගය අවසානයේ පිළිතුරු පත්‍ර සමග භාරදීම හෝ ලබා දෙන උපදෙස් පරිදි සිදු කළ යුතුය. විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටතට ගෙනයාම තහනම් වේ. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක නැවත ලියවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතු ය.

9. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම් ය. මෙම සියලු ද්‍රව්‍යයන් විභාග කොමසාරිස් ජනරාල් සතුවන අතර මෙම නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවක් ලෙස සලකනු ලැබේ.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන ලිපි ද්‍රව්‍ය හා එක් එක් විභාගයේදී ළඟ තබා ගැනීමට ලිඛිතව අවසරදී ඇති ද්‍රව්‍යයන් හැර වෙනත් සටහන් පොත්, සටහන් ඇතුළත් කොළ හෝ කොළ කැබලි යනාදිය විභාග ශාලාව තුළ විභාගයට පෙනී සිටින අවස්ථාවේදී තමා සන්තකයේ හෝ සම්පයෙහි හෝ තබා නොගත යුතු ය. එසේම විභාග ශාලාව තුළ දී ජංගම දුරකථන, විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග (Electronic Communication Devices) තමා සන්තකයේ හෝ සම්පයෙහි තබා ගැනීම සහ එම උපකරණ / උපාංග භාවිතා කර බාහිර පාර්ශ්වයන්ගේ උදව් ලබා ගැනීම හා විභාගය පැවැත්වෙන අතරතුර වෙනත් පාර්ශ්ව හා සමාජ මාධ්‍ය වෙත තොරතුරු යැවීම වංචනික ක්‍රියාවක් සේම දඬුවම් ලැබිය හැකි වරදක් වන්නේ ය.

11. විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග ඉහත 10 ඡේදයේ විස්තර කර ඇති කාර්යයන් සඳහා භාවිතා කර අසු වුවහොත් එම උපකරණ / උපාංග අදාළ විමර්ශන කටයුතු අවසන් වන තුරු විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ භාරයට ගැනීමට කටයුතු කරනු ලැබේ.

12. විභාග ශාලාවේ අසුන් ගැනීමෙන් පසු විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අවස්ථාවේදී කිසිම විභාග අපේක්ෂකයකු ළඟ, විභාගය සඳහා ගෙන ඒමට අවසර ලබාදී නොමැති කිසිදු ද්‍රව්‍යයක් හෝ උපකරණයක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන් ම තහනම් ය. විභාග ශාලාධිපති හෝ කාර්ය මණ්ඩලය නියම කළහොත් සෑම අපේක්ෂකයකුම තම සන්තකයේ තිබෙන දෑ සහතික කිරීමට සහ පරීක්ෂා කිරීමකට යටත් වන අතර මෙම අවශ්‍යතා කඩ කිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට උත්සහ දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. යම් අපේක්ෂකයකු වෙනත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ සංඥා මගින් හෝ වෙන කිසිවකින් හෝ කොපි කිරීම හෝ කොපි කිරීමට ප්‍රයත්න දැරීම හෝ වංචා සහගත ලෙස කටයුතු කිරීම හෝ වරදක් වන්නේ ය. වෙන අයදුම්කරුවකුට උදව් දීම ද වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් හෝ විභාග කාර්ය මණ්ඩලයෙන් හෝ උදව් ලබා ගැනීම ද වරදක් වන අතර උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසියට යටින් තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතු ය.

14. විභාගය ආරම්භ වී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයකුට ඉඩ දෙනු නො ලැබේ. එහෙත් වැසිකිළි/කැසිකිළි යාමට අවශ්‍යතාවයක් උදෙසා විභාග අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටතට යන්නට වුවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර කාර්ය මණ්ඩලයේ නිලධාරියකුගේ සුපරීක්ෂාකාරිත්වය යටතේ අපේක්ෂකයාට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එලෙස පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු/ඇය සෝදිසියකට භාජනය විය යුතු ය.

15. විභාග ශාලාවේ පිළිතුරු ලිවීමට පටන් ගැනීමට පෙර හෝ පසුව නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවක් වන්නේය. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ ව්‍යාජ අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීම වංචනික ක්‍රියාවක් ලෙස සලකනු ලැබේ.

16.විභාග අපේක්ෂකයකු හෝ විභාග අපේක්ෂකයකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

17. විභාග අපේක්ෂකයන් පහත උපදෙස් පරිදි ක්‍රියා කළ යුතු ය. :

(i) සෑම විභාග අපේක්ෂකයෙකුම තම ප්‍රවේශ පත්‍රයේ අත්සන සහනික කර ගැනීමත්, ඉල්ලුම් කරන ලද විෂයයන් හා ප්‍රවේශ පත්‍රයේ සඳහන් විෂයයන් අතර නොගැලපීමක් පවතින්නේ නම් විභාග දෙපාර්තමේන්තුව විමසා විභාගයට පෙර සංශෝධනය කර ගැනීමත් සිදු කළ යුතු ය.

(ii) විභාගය පටන් ගැනීමට පැය බාගයකට (1/2) පෙර විභාග ශාලාව වෙත පැමිණීම සුදුසු වන අතර විභාග ශාලාව නිශ්චිතව නොදන්නා විට විභාගය පටන් ගන්නා දිනට කලින් ඒ පිළිබඳ සොයා බලා නියම ස්ථානය නිශ්චිතව හඳුනා ගැනීම යෝග්‍ය වේ.

(iii) විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍රය ඉදිරිපත් කර තම අනන්‍යතාව තහවුරු කළයුතු ය.

(අ). අනන්‍යතාව ඔප්පු කිරීමට අවශ්‍ය ලේඛන විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට කටයුතු කරන අතර, යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ පිළිබඳ විභාග ශාලාධිපති දැනුවත් කර විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීම කටයුතු කළයුතු ය.

(ආ). සෑම අපේක්ෂකයකුම තම අනන්‍යතාව පැහැදිලිව පෙනෙන ලෙස සම්පූර්ණ මුහුණ හොඳින් හඳුනාගත හැකිවන අයුරින් විභාගය පැවැත්වෙන කාලසීමාව තුළ විභාග ශාලාවේ රැඳී සිටිය යුතු ය.

(iv) විභාග අපේක්ෂකයන් බිලූටූත් වැනි විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග (Electronic Communication Devices) භාවිතා නොකරන බව සහතික කර ගැනීම සඳහා විභාග ශාලාවේදී තම දෙකන විවෘතව පැහැදිලිව පෙනෙන ලෙස තබාගත යුතු ය.

(v) විභාග ශාලාවේදී ඔබට ලබා දෙනු ලබන කඩදාසි හැර වෙන මොන ම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුය. ඉතිරිවන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ මේසය මත තබා යා යුතු ය.

(vi) විභාග අපේක්ෂකයන් තම තමන්ගේ පැන්, පැන්සල්, මකන, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතු ය.

(vii) තමන් භාවිතා කරන පිළිතුරු ලිවීමේ පොත සහ සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය පැහැදිලිව සඳහන් කළ යුතු ය. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද, පිරිසිදුව ද උත්තර ලිවිය යුතු ය. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු එම ප්‍රශ්නයේ ම අනෙක් කොටස පටන් ගැනීමට පෙර එක් රුලක්වත් හිස්ව තිබිය යුතුය. සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය.

(viii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන් කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුය. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතු වන බැවින් ප්‍රශ්න අංක නිවැරදිව යෙදීමට කටයුතු කළ යුතු ය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳින රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද, සෑහෙන පමණ විශාලව ද තිබිය යුතු ය.

(x) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරාගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින් සඳහන් කර ඇති උපදෙස් හොඳින් කියවා බැලිය යුතුය. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට අනුව පිළිතුරු ලබාදී නොමැති අවස්ථාවලදී ලකුණු ලබා දීම සිදු කරනු නොලැබේ.

(xi) එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද පොතට අමතරව ලියන කඩදාසි පිටු අංක පිළිවෙළ අනුව එකතුකර වම් පැත්තේ ඉහළ කෙළවරේ නොගැලවෙන සේ ගැටගැසීම / ඇමිණීම කළයුතුය. පිළිතුරු පත්‍රය භාරදීමට පෙර සියලුම පිළිතුරු ලියූ කොළ අමුණා තිබේද යන්න තහවුරු කරගත යුතුය. පිළිතුරු පත්‍ර භාරදුන් පසුව විභාග මධ්‍යස්ථානයෙන් බැහැරට ගෙන ගිය කිසිදු පිළිතුරු ලියූ කඩදාසියක් ඇගයීමට ලක් කරනු නොලැබේ.

(xii) ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට හෝ ඔහුගේ කාර්යය මණ්ඩලයේ නිලධාරියකුට භාරදිය යුතුය. උත්තර පත්‍ර එකතු කරන තුරු ඔබගේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම්විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවුවහ් සේ සලකනු ලැබීමට ද හේතු විය හැකි ය.

(xiii) යම් කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතිට හෝ ඔහුගේ කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකුට කරා කිරීමට අවශ්‍ය වූ විට අන් අයට බාධාවක් නොවන සේ දෙවරක් මේසයට තට්ටු කිරීමෙන් සංඥා කළ යුතු ය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

තනතුරු - ඇබෑර්තු

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය

සමාජ සේවා දෙපාර්තමේන්තුව

වෘත්තීය උපදේශක (III ශ්‍රේණිය)

සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල වෘත්තීය උපදේශක තනතුරු පුරප්පාඩු 15 බඳවා ගැනීම සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආකෘතිය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ, සමාජ සේවා දෙපාර්තමේන්තුව, 02 වන මහල, II අදියර, සෙත්සිරිපාය, බත්තරමුල්ල ලිපිනයට 2026.11.30 **දිනට පෙර ලැබෙන සේ තැපෑලෙන් හෝ ගෙනවිත් භාර දිය යුතු ය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ** "වෘත්තීය උපදේශක තනතුරට බඳවා ගැනීම" යනුවෙන් සකස් කර තිබිය යුතු ය. www.socialservices.gov.lk වෙබ් අඩවිය හරහා ද ආදර්ශ අයදුම්පත හා විස්තර ලබා ගත හැක.

මෙම තනතුර සඳහා අයදුම් කිරීමට බලාපොරොත්තු වන නිලධාරීන් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

1. **තනතුරු පුරප්පාඩු ආයතන - 15**

අනු. අංකය	*වෘත්තීය උපදේශක තනතුර*	*වෘත්තීය පුහුණු ආයතනය*	*තනතුරු සංඛ්‍යාව*
01	ජලනල කාර්මික ශිල්පී	අමුණුකුඹුර වෘත්තීය පුහුණු ආයතනය	03
		කැටවල වෘත්තීය පුහුණු ආයතනය	
		සිදුව වෘත්තීය පුහුණු ආයතනය	
02	විසිතුරු ආභරණ ශිල්පී	තෙළඹුයාය වෘත්තීය පුහුණු ආයතනය	03
		මඩකලපුව වෘත්තීය පුහුණු ආයතනය	
		කලවාන වෘත්තීය පුහුණු ආයතනය	
03	කර්මාන්තශාලා මහන යන්ත්‍ර ක්‍රියාකරු	තෙළඹුයාය වෘත්තීය පුහුණු ආයතනය	02
		අමුණුකුඹුර වෘත්තීය පුහුණු ආයතනය	
04	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය	මාදම්පේ වෘත්තීය පුහුණු ආයතනය	02
		කිලිනොච්චිය වෘත්තීය පුහුණු ආයතනය	
05	වෙළඳ සහායක	තෙළඹුයාය වෘත්තීය පුහුණු ආයතනය	01
06	ටේලර්	කිලිනොච්චිය වෘත්තීය පුහුණු ආයතනය	01
07	කඩදාසි ප්‍රතිවක්‍රීකරණ කාර්මික ශිල්පී	මඩකලපුව වෘත්තීය පුහුණු ආයතනය	01
08	රූපලාවන්‍ය ශිල්පී	වත්තේගම වෘත්තීය පුහුණු ආයතනය	01
09	බේකරි ශිල්පී (පේස්ට්‍රි සහ බේකරි)	තෙළඹුයාය වෘත්තීය පුහුණු ආයතනය	01
මුළු පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව			15

1.1 **විවෘත බඳවා ගැනීම**

1.1.1 **වයස් සීමාව :-**

අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 35ට නොවැඩි විය යුතු යි.

1.1.2 අධ්‍යාපන සුදුසුකම් :-

(අ) වෘත්තීය උපදේශක (ආහාර තාක්ෂණය/ බේකරි හා පේස්ට්‍රි නිෂ්පාදනය) තනතුරු සඳහා සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසී භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට (02) සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා/පෙළ) විභාගය සමත්වී තිබීම;

(ආ) වෘත්තීය උපදේශක (ආහාර තාක්ෂණය/ බේකරි හා පේස්ට්‍රි) තනතුරු හැර අනෙකුත් තනතුරු සඳහා අධ්‍යාපන සුදුසුකම්.

(i) සිංහල/ දෙමළ/ භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

සහ

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගයේදී ඕනෑම විෂයය ධාරාවකින් සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තෘතියික අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය සාධන මට්ටම ලබා තිබීම.

1.1.3 වෘත්තීය සුදුසුකම් :-

අදාළ වෘත්තීය පිළිබඳ ලංකා කාර්මික විද්‍යාලයෙන් හෝ ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ දෑ අවුරුදු හෝ ඊට වැඩි සහතික පත්‍රය;

හෝ

කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ හෝ පේෂකර්ම දෙපාර්තමේන්තුවේ දෑ අවුරුදු හෝ ඊට වැඩි සහතික පත්‍රය;

හෝ

සමාජ සේවා දෙපාර්තමේන්තුව හෝ ජාතික තරුණ සේවා සභාව හෝ ඊට අනුබද්ධ ආයතනයකින් ලබා ගත් අදාළ වෘත්තීය පිළිබඳ දෑ අවුරුදු හෝ ඊට වැඩි සහතික පත්‍රය ලබා තිබීම;

හෝ

වෘත්තීය පුහුණු අධිකාරිය හෝ ඊට අනුබද්ධ ආයතනයකින් ලබා ගත් අදාළ වෘත්තීය පිළිබඳ දෑ අවුරුදු හෝ ඊට වැඩි සහතික පත්‍රය ලබා තිබීම.
තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) මට්ටමට ඇතුළත් වන්නා වූ අදාළ තාක්ෂණික පාඨමාලාවක් හෝ ඒ හා සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතික ලබා තිබීම.

1.1.5. **කායික සුදුසුකම් :-**
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

1.1.6. වෙනත් :-

i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම.
ii. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත වීම.
iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම්, අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ *ගැසට් පත්‍රයේ* සඳහන් කරන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

1.1.7. **බඳවා ගැනීමේ ක්‍රමය :-**

ලිඛිත හා වෘත්තිය පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනේ.

1.1.7.1 ලිඛිත පරීක්ෂණය :-

විෂයයන්	*කාලය*	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත් ලකුණු ප්‍රමාණය*
බුද්ධි පරීක්ෂණය	කාලය පැය 01	100	40
අවබෝධය	කාලය පැය 01	100	40

1.1.7.2 වෘත්තිය පරීක්ෂණය :- වෘත්තීය උපදේශක ප්‍රායෝගික දැනුම පරීක්ෂා කිරීම

විෂයයන්	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත් ලකුණු ප්‍රමාණය*
01. පාඩමට පෙර පන්තිය සූදානම් කර ගැනීම	25	40%
02. පාඩමට පිවිසීම	25	
03. උපදේශකවරයාගේ විෂය පිළිබඳ දැනුම	25	
04. අභ්‍යාසලාභීන්ගේ අවධානය දිනාගැනීමට යොදා ගන්නා ශිල්පීය ක්‍රමයන්හි සක්‍රීයභාවය	25	
එකතුව	100%	

1.1.8 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය:-

තනතුරට නියමිත සුදුසුකම් සපුරා තිබේද යන්න පරීක්ෂා කිරීම සඳහා සහතිකපත් පරීක්ෂාව (ලකුණු ලබාදෙනු නොලැබේ.)

1.1.9. වැටුප් පරිමාණය :-

රා.ප.ව. 10/2025 අනුව MT-01 -2025
වැටුප් පරිමාණය රු.50,090-10x540-11x630-10x1,010-10x1,190-84,420/- වේ.
(මෙම වැටුප් පරිමාණය 2027.01.01 දින සිට ක්‍රියාත්මක වේ.)

1.1.10 සටහන :

ලිඛිත සහ වෘත්තීය පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ. ලිඛිත පරීක්ෂණය සමත් අයදුම්කරුවන්ගෙන් දෙගුණයක් වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, එම අවස්ථාවේදීම සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් සම්පූර්ණ කරන අයදුම්කරුවන් අතුරින් ලිඛිත හා වෘත්තීය පරීක්ෂණ දෙකෙහි මුලු ලකුණු එකතුවෙහි කුසලතා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව සඳහා බඳවා ගනු ලැබේ .

1.1.11. සේවා කොන්දේසි :-

මෙම තනතුර ස්ථීරය, විශ්‍රාම වැටුප් සහිතය, විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතු අතර වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් ගෙවිය යුතු ය. රා.ප.ව. 18/2020 හා ඊට ආනුශංගික වක්‍රලේඛ අනුව වසර තුනක් තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතු ය.

1.1.12. සටහන :

ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් ඉල්ලුම් කළ යුතු අතර තෝරා ගත් අයදුම්කරුවන් අදාළ පුරප්පාඩු සහිත ආයතනයේ වසර පහක් අනිවාර්යෙන්ම සේවය කළ යුතු ය.

දර්ශනී කරුණාරත්න,
සමාජ සේවා අධ්‍යක්ෂ.

2026 ඔක්තෝබර් මස 26 දින,
සමාජ සේවා දෙපාර්තමේන්තුව,
2 වන මහළ,
II වන අදියර,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

..... තනතුර සඳහා බඳවාගැනීමේ අයදුම්පත්‍රය

භාෂා මාධ්‍යය

1. මුලකුරු සමඟ නම :-.....
2. මුලකුරු වලින් හැඳින්වෙන නම් :-.....
   .....
3. ලිපිනය :- .....
4. දුරකථන අංකය :- .....
5. ජාතික හැඳුනුම්පත් අංකය :- .....
6. උපන් දිනය :- .....
7. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :- අවුරුදු:-..... මාස:-..... දින:-.....
8. විවාහක/ අවිවාහක බව :- .....
9. ස්ත්‍රී / පුරුෂ භාවය :- .....

10. අධ්‍යාපන සුදුසුකම් :-

I. අ.පො.ස. (සාමාන්‍ය පෙළ)

වර්ෂය :- ..... විභාග අංකය:- .....

විෂයයන්	*ශ්‍රේණිය*	*විෂයයන්*	*ශ්‍රේණිය*
ගණිතය			
සිංහල/දෙමළ/ඉංග්‍රීසි			

II අ.පො.ස (උසස් පෙළ)

වර්ෂය :- ..... විභාග අංකය:- .....

විෂයයන්	*ශ්‍රේණිය*	*විෂයයන්*	*ශ්‍රේණිය*

11. වෘත්තීය හා වෙනත් සුදුසුකම් :-

පාඨමාලාවේ නම	*ආයතනය*	*පාඨමාලා කාලය*

12. පළපුරුද්ද:-

.....
.....
.....

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය අනුව සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

.....
අයදුම්කරුගේ අත්සන.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

මුදල් අමාත්‍යාංශය

තක්සේරු දෙපාර්තමේන්තුව

නීති නිලධාරි (විධායක නිලධාරි ගණයේ III ශ්‍රේණියේ) තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2026

මුදල් අමාත්‍යාංශයේ, තක්සේරු දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III වන ශ්‍රේණියේ නීති නිලධාරි තනතුරේ පවතින පුරප්පාඩුව පිරවීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. **බඳවා ගැනීමේ ක්‍රමය :**

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 06 යටතේ සඳහන්) ලකුණු ලබාදීමේ පටිපාටියට අනුකූලව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.
අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය 2026.12.04 වේ.

02. අවශ්‍ය සුදුසුකම් :

(i) අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම් :

ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් දිවුරුම් දී තිබීම.

(ii) පළපුරුද්ද :

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු නීතිඥවරයකු වශයෙන් වසර තුන (03) කට නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම. (සක්‍රීය වෘත්තීය පළපුරුද්ද සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනවල පළපුරුද්ද ලබාගත් කාලය, සහතික කරන්නාගේ නිලමුද්‍රාව හා සහතික කළ දිනය පැහැදිලිව සඳහන් කර තිබිය යුතු ය.)

හෝ

ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු රාජ්‍ය ආයතනයක නීතිමය තනතුරක * වසර තුන (03) කට නොඅඩු පහත දැක්වෙන කාර්යයන්වලට අදාළ පළපුරුද්ද ලබා තිබීම. (ලේකම්/ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානි විසින් නිකුත් කළ ලිපියකින් සනාථ කර තිබිය යුතු ය.)

I. නඩු සම්බන්ධයෙන් නීති කටයුතු හා නීතිපති දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීරණ කටයුතු කිරීම.
II. ගිවිසුම් හා සම්බන්ධ නෛතික කටයුතු.
III. අදාළ අණපනත් සම්බන්ධව නෛතික කටයුතු.
IV. පනත්, කෙටුම්පත්, වක්‍රලේඛ, රෙගුලාසි වැනි නීත්‍යානුකූල ලියවිලි සම්පාදන කටයුතු.
V. විවිධ ව්‍යවස්ථාපිත ආයතනවලින් පවත්වනු ලබන නීති හෝ අධිකරණ කටයුතු හෝ පරීක්ෂණ කටයුතු.

සටහන : මූලික සුදුසුකම සනාථ කෙරෙන ලේඛනවල අයදුම්කරු විසින්ම සහතික කළ පිටපත් අයදුම්පත්‍රයට අමුණා තිබිය යුතු ය. සේවා කාලය ආරම්භ වන හා අවසාන වන දිනය පැහැදිලිව සඳහන් කර සහතික අමුණා නොමැති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

*නීතිමය තනතුරක් යනු නීති උපාධිය හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දී තිබීම බඳවා ගැනීමේ මූලික සුදුසුකමක් වන තනතුරුය.

(iii) කායික යෝග්‍යතාව :

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

(iv) වෙනත් සුදුසුකම් :

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
- අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
- අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ. ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

(ii) මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් ය. තනතුරට බඳවාගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීම පටිපාටියේ සඳහන් ආකාරයට පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(iii) අංක 18/2020 දරන 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුව, නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ/ රාජ්‍ය භාෂාවල ප්‍රවීණතාව ලබා ගත යුතු ය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

(v) ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලබන අතර, ඔබ පත්වීම ලැබීමට සුදුසුකම්ලත් භාෂා මාධ්‍ය වනුයේ, ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍ය වේ.

04. වයස් සීමාව :

අයදුම්පත් කැඳවන අවසන් දිනට වයස අවු. 21 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.

05. වැටුප් පරිමාණය :

අංක 10/2025 දරන 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 82,150-10x2,400-8x2,940- රු. 195,970/- (SL-1-2025) වේ. එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එහි උපලේඛන III හි සඳහන් පරිදි වේ.

06. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.

අනු. අංකය	*විෂයය*	*ලකුණු*	*උපරිම ලකුණු*
01	අතිරේක අධ්‍යාපන සුදුසුකම්		25
	(*අ*) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගන්නා ලද නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය	25	
	(*ආ*) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් නීතිය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ උසස් නීති අධ්‍යාපන ආයතනයෙන් ලබාගත් පශ්චාත් නීති ඩිප්ලෝමාවක්	20	
	(*ඇ*) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගන්නා ලද,		
	• පළමු පන්තියේ සාමාර්ථය සහිත නීතිවේදී උපාධිය	15	
	• දෙවන පන්තියේ ඉහළ සාමාර්ථය සහිත නීතිවේදී උපාධිය	10	
	• දෙවන පන්තියේ පහළ සාමාර්ථය සහිත නීතිවේදී උපාධිය	07	
	• සාමාන්‍ය සාමාර්ථයක් සහිත නීතිවේදී උපාධිය	05	
	(*ඈ*) නීති විද්‍යාලයේ අවසන් වසරේ පළමු පන්තියේ සාමාර්ථය	10	
	නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථය	05	

<table>
<tr><th>අනු. අංකය</th><th>විෂයය</th><th>ලකුණු</th><th>උපරිම ලකුණු</th></tr>
<tr><td></td><td>සටහන I : නීති විද්‍යාලයේ අවසන් විභාගය ගෙරව සාමාර්ථයක් සහිතව සමත් වී ඇත්නම් පමණක් ඉහත ලකුණු 05 ලබා දෙනු ලැබේ.
සටහන II : ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.</td><td></td><td></td></tr>
<tr><td>02</td><td>අතිරේක පළපුරුද්ද :

නඩුවලට අදාළ ලේඛන සකස් කිරීම සහ විවෘත අධිකරණයේ කරුණු දැක්වීම
<table>
<tr><th></th><th>නඩු ගොනු කිරීම (එක් නඩුවක් සඳහා)</th><th>අධිකරණය ඉදිරියේ පෙනී සිට කරුණු දැක්වීම සඳහා ලකුණු (එක් නඩුවක් සඳහා)</th></tr>
<tr><td>ශ්‍රේෂ්ඨාධිකරණය</td><td>2</td><td>5</td></tr>
<tr><td>අභියාචනාධිකරණය</td><td>2</td><td>4</td></tr>
<tr><td>මහාධිකරණය</td><td>2</td><td>3</td></tr>
<tr><td>දිස්ත්‍රික් උසාවි</td><td>4</td><td>5</td></tr>
<tr><td>විනිශ්චයාධිකාර</td><td>2</td><td>3</td></tr>
</table>

සටහන -
ඉහත සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ නඩු තීන්දුවල පිටපත් හෝ අවසන් වරට නඩුව පැවති දිනයේ නඩු වාර්තාවේ සහතික පිටපතක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු ය.</td><td></td><td>35</td></tr>
<tr><td>03</td><td>භාෂා හැකියාව
(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස ඇතුළත්ව ලබාගත් උපාධිය.
(ආ) පිළිගත් අන්තර්ජාතික හෝ ජාතික මට්ටමේ ආදර්ශ අධිකරණ තරගවලදී (Moot court competitions) දක්වා ඇති ඉංග්‍රීසි භාෂාවේ ව්‍යක්ත බව
කේවල
i ප්‍රථම ස්ථානය/ හොඳම කුසලතාව - 12
ii දෙවන ස්ථානය - 10
iii තෙවන ස්ථානය/ වෙනත් කුසලතා - 08
කණ්ඩායම්
i ප්‍රථම ස්ථානය/ හොඳම කුසලතාව - 10
ii දෙවන ස්ථානය - 08
iii තෙවන ස්ථානය/ වෙනත් කුසලතා - 06
(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් ඩිප්ලෝමාවක් හෝ වෙනත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් SLQE 3 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක් හෝ රජයේ පුහුණු ආයතනයකින් / රජයේ පුහුණු ආයතනයකට අනුබද්ධ ආයතනයකින් අවම වශයෙන් අධ්‍යයන පැය 1500 ක පාඨමාලාවක් හදාරා ලබාගත් ඉංග්‍රීසි භාෂාව සඳහා ඩිප්ලෝමාවක්.</td><td>

15

12

10</td><td>15</td></tr>
</table>

අනු. අංකය	විෂයය	ලකුණු	උපරිම ලකුණු
	(ඈ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී (දේශීය හෝ ලන්ඩන්) ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් අධිසාමාර්ථයක් ලබා තිබීම හෝ IELTS සමස්ථ ලකුණු 6.5 හෝ ඊට ඉහළ, TOEFL-IBT 79 හෝ ඊට ඉහළ, TOEFL-CBT 213 හෝ ඊට ඉහළ හෝ TOEFL-PBT 550 හෝ ඊට ඉහළ වීම.	08	
	(ඉ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් උසස් සහතික පත්‍රයක් හෝ වෙනත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් SLQF 2 මට්ටමේ සහතිකයක්.	05	
	සටහන : ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.		
04	තොරතුරු තාක්ෂණය/ තොරතුරු තාක්ෂණ නීතිය පිළිබඳ දැනුම		10
	(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය හෝ පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා තිබීම සඳහා.	10	
	(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් හෝ වෙනත් රජය පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නීතිය පිළිබඳ ඩිප්ලෝමාවක්.	08	
	(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ වෙනත් ආයතනයකින් ලබාගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ NVQ 5 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක්.	05	
	(ඈ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ හෝ වෙනත් රජය පිළිගත් වෘත්තීය ආයතනයක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නීති ක්ෂේත්‍රයේ පාඨමාලා හදාරා/ පුහුණු වැඩසටහන්වලට සහභාගි වී ලබාගත් සහතික පත්‍ර (එක් සහතිකයකට ලකුණු 02 බැගිනි උපරිම සහතික දෙකකට ලකුණු ලබා දෙනු ලැබේ.)	04	
	සටහන : ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.		
	සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය තනතුරෙහි භූමිකාව ඉටුකිරීමට උපස්ථම්භවන අයදුම්කරුගේ : • ශක්තීන් (Strength questions) (ලකුණු 02), • අවස්ථානුකූලව තීරණ ගැනීමේ හැකියාව (Situational questions) (ලකුණු 03) හා • දක්ෂතාව (Competency questions) (ලකුණු 10) ඇගයීමට ලක් කිරීම අරමුණු කරගත් ප්‍රශ්නවලට ලබාදෙන පිළිතුරු අනුව ලකුණු පිරිනමනු ලැබේ.		15
	එකතුව		**100**

07. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින් ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතික පත්‍රවල මුල් පිටපත් හා අයදුම්කරු විසින් ම නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත් පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත;
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

8. අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය :

(i) **අයදුම්පත් 2026.12.04 වැනි දිනට හෝ ඊට ප්‍රථම ''රජයේ ප්‍රධාන තක්සේරුකරු, රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව, අංක 748, මරදාන පාර, කොළඹ 10''** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 08 දක්වා ත් දෙවැනි පිටුව 09 සිට 11 දක්වාත් තෙවැනි පිටුව 12 සිට 13 දක්වාත් වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

(iii) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ **"මුදල් අමාත්‍යාංශයේ, තක්සේරු දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම - 2026"** යනුවෙන් සඳහන් කළ යුතු ය.

(iv) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන, රජයේ පාසල් ප්‍රධානියෙකු/ විශ්‍රාමික නිලධාරියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීවරයා, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධරයකු, රජයේ / පළාත් රාජ්‍ය සේවයේ ස්ථීර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජාස්ථානයක භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙකු විසින් සහතික කළ යුතු ය.

(v) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත්, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

(vi) මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

9. සාවද්‍ය තොරතුරු සැපයීම :

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පුරප්පාඩුව පිරවීම, නොපිරවීම හෝ පුරප්පාඩුවලින් කොටසක් පිරවීම පිළිබඳ අවසන් තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

11. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

12. මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ගය තුළ කිසියම් ගැටළුකාරී තත්ත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණ අවසාන තීරණ වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
මුදල් අමාත්‍යාංශය.

2026, ඔක්තෝබර් මස 30 වැනි දින.

ආදර්ශ අයදුම්පත්‍රය

මුදල් අමාත්‍යාංශයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ
නීති නිලධාරි (විධායක නිලධාරි ගණයේ III ශ්‍රේණියේ) තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2026

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි)

(අයදුම් කරන මාධ්‍යයට අදාළ අංකය කොටුව තුළ ලියන්න.)
සිංහල - 2/ දෙමළ - 3/ ඉංග්‍රීසි - 4 [ ]

සටහන :- අයදුම් කරනු ලබන මාධ්‍යය වෙනස් කළ නොහැක.

1.0 1.1 සම්පූර්ණ නම (මයා/මිය/මෙය) : .....
(සිංහලෙන්/ දෙමළෙන්) .....

1.2 සම්පූර්ණ නම : .....
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) .....

1.3 මුලකුරු සමග නම (මයා/මිය/ මෙය) : .....
(සිංහලෙන්/ දෙමළෙන්) උදා : එම්. ජී. බී. එස්. කේ. ගුණවර්ධන

1.4 මුලකුරු සමග නම : .....
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : GUNAWARDHANA, M.G.B.S.K.)

2.0 2.1 ස්ථිර ලිපිනය : .....
(සිංහලෙන්/ දෙමළෙන්)

2.2 ස්ථිර ලිපිනය : .....
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 3.1 ස්ත්‍රී/ පුරුෂ භාවය : පුරුෂ 0 [ ]

ස්ත්‍රී 1 (අංකය කොටුව තුළ ලියන්න)

3.2 විවාහක/ අවිවාහක බව : විවාහක - 1 [ ] (අදාළ කොටුව තුළ ලියන්න)

අවිවාහක - 2

3.3 උපන් දිනය : වර්ෂය : [ ][ ][ ][ ] මාසය : [ ][ ] දිනය : [ ][ ]

3.4 2025 ..... දිනට වයස : අවුරුදු : [ ][ ] මාස : [ ][ ] දින : [ ][ ]

3.5 ජාතික හැඳුනුම්පත් අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

4.0 4.1 දුරකථන අංකය : ස්ථාවර : | | | | | | | | | | |

ජංගම : | | | | | | | | | | |

5.0 අධ්‍යාපන සුදුසුකම් :

5.1 උපාධිය ආයතනය දිනය

....

....

6.0 ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දුන් දිනය : .....

6.1 ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දීමෙන් පසු වසර 03ක පළපුරුද්ද සම්පූර්ණ කරන ලද දිනය : .....

6.2 රාජ්‍ය ආයතනයක නීතිමය තනතුරක වසර 03ක පළපුරුද්ද සම්පූර්ණ කරන ලද දිනය : .....

*මූලික සුදුසුකම් සනාථ කෙරෙන සහතික/ ලේඛන අයදුම්කරු විසින් ම සත්‍ය බවට සහතික කර අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතු ය.

7.0 අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 06 යටතේ වූ එක් එක් සුදුසුකම් ලබා ගැනීමට අදාළ විස්තර :-

7.1 අතිරේක අධ්‍යාපන සුදුසුකම් : .....
.....

7.2 අතිරේක වෘත්තීය සුදුසුකම් : .....
.....

7.3 තොරතුරු නාක්ෂණය පිළිබඳ දැනුම : .....
.....

7.4 භාෂා හැකියාව : .....
.....

*අතිරේක සුදුසුකම් සනාථ කෙරෙන ලේඛන අයදුම්පත හා එවිය යුතු නොවන අතර, එම ලේඛන සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කිරීමට සූදානම් කර තබා ගැනීම අයදුම්කරුගේ වගකීමකි.

8.0 ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?
(ඔව් නම් විස්තර කරන්න)

.....

9.0 අයදුම්කරුගේ සහතිකය :-

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවත්, මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ

පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන මා දන්නා බවත්, සියලු නීතිරීතිවලට මම යටත් වන බවත් ප්‍රකාශ කරමි.

....,
දිනය අයදුම්කරුගේ අත්සන.

10.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..... මයා/ මිය/ මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද ඔහු/ ඇය මා ඉදිරිපිට දී ..... දින ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බව ද, සහතික කරමි.

.....,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

සම්පූර්ණ නම :
තනතුර :
දිනය :
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

11.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය : (රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින් සඳහා පමණි)

ඉහත විස්තර සඳහන් ..... මහතා/ මහත්මිය/ මෙනෙවිය මෙම ආයතනයේ සේවය කරන බවත්, ඔහු/ ඇය විසින් සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, වැඩ හා පැමිණීම සතුටුදායක බවත්, ඔහුට/ ඇයට විරුද්ධව කිසිදු චෝදනාවක් නොවන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි බවත් සහතික කරමි.

.....,
දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :
පදවි නාමය :
ලිපිනය :
දිනය :
(නිල මුද්‍රාව යොදන්න)

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ වූ ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරයේ කථිකාචාර්ය (ක්ෂේත්‍රගත/ කාර්යාලගත නිලධාරි බණ්ඩ 01 සේවා ගණයේ II ශ්‍රේණිය) තනතුර සඳහා **විවෘත පදනම මත බඳවා ගැනීම - 2026**

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ඇති ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරයේ ක්ෂේත්‍රගත/ කාර්යාලගත නිලධාරි බණ්ඩ 01 සේවා ගණයේ II ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුරේ පවතින පුරප්පාඩුව පිරවීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. පුරප්පාඩු ගණන - එකක් (01)

2. අවශ්‍ය සුදුසුකම්:

(i.) **අධ්‍යාපන සුදුසුකම්**

(*අ*) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්ව විද්‍යාලයකින් පිරිනමනු ලබන උපාධියක්, හෝ

(*ආ*) ශ්‍රී ලංකා පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන උපාධියක් හෝ

(*ඇ*) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ පිළිගත් උපාධියක් ලබා තිබීම

(ii.) **පළපුරුද්ද:**

කථිකාචාර්ය / දේශක, ප්‍රදර්ශක (Demonstrator) යනාදී වශයෙන් තනතුරට අදාළව වසර (01) පළපුරුද්දක් තිබීම.

සටහන : මූලික සුදුසුකම් සනාථ කෙරෙන ලේඛනවල අයදුම්කරු විසින්ම සහතික කළ පිටපත් අයදුම්පත්‍රයට අමුණා තිබිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කරනු ලබන සහතිකපත්වල අදාළ කාල සීමාවන් පිළිබඳව සඳහන් නොවන්නේ නම් එවැනි සහතික පත්‍රවලට අදාළ කාල සීමාවන් අදාළ ආයතන මගින් ලිඛිතව තහවුරු කරවාගෙන ඉදිරිපත් කිරීම අයදුම්කරුගේ වගකීම වේ. එසේ කාලසීමාවක් සඳහන්ව නොමැති සහ කාලසීමාව තහවුරු නොකළ සහතික පත්‍ර ලකුණු ලබා දීම සඳහා සලකා බලනු නොලැබේ.

(iii.) **වයස් සීමාව :**

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21 ට නොඅඩු සහ අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

(iv.) **වැටුප් පරිමාණය :**

අංක 10/2025 දරන 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රෙල්ඛයේ විධිවිධාන අනුව මෙම පත්වීමට හිමි මාසික වැටුප් පරිමාණය රු. 62,230-10x,1,190 -11x1,360- 15x1,670-රු. 114,140 (MN 06 -2025) වේ.

(v.) **කායික සුදුසුකම් :**

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(vi.) **වෙනත් :**

(*අ*) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

(*ආ*) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය. (ඒ බව අයදුම්කරු පදිංචි වසමේ ග්‍රාම නිලධාරි වෙතින් මාස 06ක් ඇතුළත ලබාගත් DS 04 සහතිකය සහ තවත් චරිත සහතිකයකින් සනාථ කළ යුතු ය).

(*ඇ*) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ *නිවේදනයේ/ ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

3. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි:

(i) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

(ii) මෙම පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් ය. තනතුරට බඳවා ගෙන වසර 03 ක් ඇතුළත බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් ආකාරයට පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(iii) 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 18/2020 හි සඳහන් විධිවිධාන අනුව, නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ/ රාජ්‍ය භාෂාවල ප්‍රවීණතාව ලබා ගත යුතු ය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසි වලට ද රජයේ වෙනත් රෙගුලාසි, චක්‍රලේඛ හා උපදෙස්වලට හා විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ වූ ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරයේ ක්ෂේත්‍රගත/කාර්යාලගත නිලධාරි ඛණ්ඩ 01 සේවා ගණයෙහි 11 ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් විධිවිධාන වලටද, ඒවාට අදාළව වරින්වර නිකුත් කරනු ලබන සංශෝධනවලට ද ඔබ යටත්විය යුතු වේ.

(v) අයදුම් කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලබන අතර, ඔබ පත්වීම ලැබීමට සුදුසුකම්ලත් භාෂා මාධ්‍ය වනුයේ, ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍ය වේ.

4. බඳවා ගැනීමේ ක්‍රමය :

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින්, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම් විසින් බලය පවරනු ලබන ආයතනයක් මගින් පවත්වනු ලබන ලිඛිත විභාගයකින් හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ.

(*අ*) ලිඛිත විභාගය :

විෂයයන්	*කාලය*	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත් ලකුණු ප්‍රමාණය*
බුද්ධි පරීක්ෂණය	පැය 01	100%	40%
පොදු ප්‍රශ්න පත්‍රය	පැය 01	100%	40%

(*ආ*) විභාගය සඳහා වන විෂයය නිර්දේශය :

ප්‍රශ්න පත්‍රයේ නම	*විෂයය නිර්දේශය*
බුද්ධි පරීක්ෂණය	අපේක්ෂකයා සතු සාමාන්‍ය බුද්ධිය, තර්කන හැකියාව, අදහස් ප්‍රකාශනය, සංඛ්‍යාත්මක කුසලතාවය, හා අවබෝධාත්මක හැකියාව මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි.
පොදු ප්‍රශ්න පත්‍රය	සංයුක්ත ගණිතය/ශුද්ධ ගණිතය හා ව්‍යවහාරික ගණිතය, භෞතික විද්‍යාව, පරිගණක විද්‍යාව, තාරකා විද්‍යාව, අභ්‍යවකාශ විද්‍යාව, නව සොයා ගැනීම් පිළිබඳ මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි.

(*ඇ*) යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :

පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ	*උපරිම ලකුණු ප්‍රමාණය*	*අවම ලකුණු ප්‍රමාණය*
1. දේශන පැවැත්වීමේ හැකියාව (ඉදිරිපත් කිරීමක් /Presentation කිරීමේ හැකියාව)	60	
2. තාරකා විද්‍යාව පිළිබඳ දැනුම	25	
3. දුරේක්ෂ පිළිබඳ දැනුම	10	අදාළ නොවේ.
4. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අභිමතය පරිදි කුසලතා, නායකත්වය, ආකල්ප පෞරුෂත්වය හා සන්නිවේදන කුසලතා	05	

5. **අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :**

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතික පත්‍රවල මුල් පිටපත් හා අයදුම්කරු විසින්ම සත්‍ය පිටපත් බවට සහතික කරන ලද ඡායා පිටපත් ගොනු 02කින් ඉදිරිපත් කළ යුතු ය.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ :

(i.) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;
(ii.) වලංගු විදේශ ගමන් බලපත්‍රය;
(iii.) වලංගු රියදුරු බලපත්‍රය.

6. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය:

(i.) **අයදුම්පත් 2026.11.30 වැනි දිනට හෝ ඊට ප්‍රථම "ලේකම්, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය, 3 වන මහල, සෙත්සිරිපාය පළමු අදියර, බත්තරමුල්ල"** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii.) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 05 දක්වාත් දෙවන පිටුව අංක 06 සිට 09 දක්වාත් වන ආකාරයෙන් පිළියෙළ කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

(iii.) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ **"ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරයේ කථිකාචාර්ය II ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම"** යනුවෙන් සඳහන් කළ යුතු ය.

(iv.) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයකු/ නීතිඥවරයකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරීන් නිලධරයකු හෝ රු. 62,230/- ක හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතු ය.

(v.) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත්, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

(vi.) මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

7. සාවද්‍ය තොරතුරු සැපයීම :

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

8. පුරප්පාඩුව පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශ ලේකම් සතු වේ.

9. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

10. මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ගය තුළ කිසියම් ගැටළුකාරී තත්ත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශ ලේකම් විසින් ගනු ලබන තීරණ අවසාන තීරණ වේ.

එච්. නයනා එස්. ටී. කේ. ද සිල්වා,
ලේකම් (*වැ.බ*),
විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය.

2026 නොවැම්බර් මස 04 දින,
විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය.

ආදර්ශ අයදුම්පත

ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරයේ කථිකාචාර්ය II වන ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීම.

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)
(අයදුම් කරන මාධ්‍යයට අදාළ අංකය කොටුව තුළ ලියයන්න.)

(සිංහල - 2 / දෙමළ - 3 / ඉංග්‍රීසි - 4) | |

සටහන : අයදුම් කරනු ලබන මාධ්‍යය වෙනස් කළ නොහැක.

1.0 1.1 සම්පූර්ණ නම (මයා/මිය/මෙය) : .....
(සිංහලෙන්/දෙමළෙන්) : .....

1.2 සම්පූර්ණ නම :.....
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :.....

1.3 මුලකුරු සමහ නම (මයා/මිය/මෙය) : .....
(සිංහලෙන්/දෙමළෙන්) උදා : එම්.ජී.බී.එස්.කේ. ගුණවර්ධන.

1.4 මුලකුරු සමහ නම : .....
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :

2.0 2.1 ස්ථිර ලිපිනය : .....
(සිංහලෙන්/දෙමළෙන්)

2.2 ස්ථිර ලිපිනය : .....
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 3.1 ස්ත්‍රී / පුරුෂ භාවය: (පුරුෂ - 0, ස්ත්‍රී - 1) | |

3.2 විවාහක/අවිවාහක බව: (විවාහක - 1, අවිවාහක - 2) | |

3.3 උපන් දිනය: වර්ෂය : | | | | | මාසය : | | | දිනය : | | |

3.4 2026 ..... දිනට වයස: අවුරුදු : | | | මාස : | | | දින : | | |

3.5 ජාතික හැඳුනුම්පත් අංකය: | | | | | | | | | | | | |

4.0 දුරකථන අංකය : ස්ථාවර : | | | | | | | | | | |

ජංගම : | | | | | | | | | | |

5.0 අධ්‍යාපන සුදුසුකම් :

- 5.1 උපාධිය ලබාගත් ආයතනය ලබාගත් දිනය
  ....
  ....

6.0 පළපුරුද්ද: .....

.....

.....

***** මූලික සුදුසුකම් සනාථ කෙරෙන සහතික/ ලේඛන අයදුම්කරු විසින්ම සත්‍ය බවට සහතික කර අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතු ය.

7.0 අයදුම්කරුගේ සහතිකය :

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවත්, ම විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බව මා දන්නා බවත්, සියලු නීතිරීතිවලට මම යටත්වන බවත් ප්‍රකාශ කරමි.

....., ...,

දිනය අයදුම්කරුගේ අත්සන.

8.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .....මහතා/මහත්මිය/මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන තැබූ බවත් සහතික කරමි.

.....,

අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

සම්පූර්ණ නම :
තනතුර :
දිනය :
(නිල මුද්‍රාව තබන්න)

9.0 දෙපාර්තමේන්තු ප්‍රධානීගේ නිර්දේශය (රාජ්‍ය සේවයේ නියුක්තිකයින් සඳහා පමණි)

ඉහත විස්තර සඳහන් ..... මහතා/මහත්මිය/මෙනෙවිය මෙම ආයතනයේ සේවය කරන බවත්, ඔහු/ඇය විසින් සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, වැඩ හා පැමිණීම සතුටුදායක බවත්, ඔහුට/ඇයට විරුද්ධව කිසිදු චෝදනාවක් නොවන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි බවත් සහතික කරමි.

.....,

දෙපාර්තමේන්තු ප්‍රධානීගේ අත්සන.

නම :
පදවි නාමය :
ලිපිනය :
දිනය :
(නිල මුද්‍රාව තබන්න)

විභාග - විභාග ප්‍රතිඵල ආදිය

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු පරීක්ෂක තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

Open Competitive Examination for Recruitment to Post of Inspector of Excise in Excise Department of Sri Lanka - 2026

සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු පරීක්ෂක තනතුරෙහි පවතින පුරප්පාඩු පනස් හතරක් (54) සඳහා විවෘත පදනම මත බඳවා ගැනීමට පවත්වනු ලබන තරග විභාගයට පහත සඳහන් සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ඒ සඳහාවන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications (Recruitment/ EB Exams)" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (Online) ක්‍රමයට පමණි. **මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2026 නොවැම්බර් මස 09 වැනි දින පෙ.ව 9.00ට විවෘත වන අතර 2026 දෙසැම්බර් 07 වැනි දින ප.ව 9.00ට අවසන් වේ.**

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳදරා ගත යුතු ය.

මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් 2027 පෙබරවාරි මස කොළඹ දී පවත්වනු ඇත.

01. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :

විභාග කොමසාරිස් ජනරාල් මගින් ලිඛිත තරග විභාගයක් පවත්වා එම ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට යොමු කර ලිඛිත විභාගයෙන් හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගත් මුළු ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙල මත හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරුවලට බඳවා ගනු ලැබේ.

තනතුරේ සාමාන්‍ය රාජකාරි විස්තරය :

සුරාබදු ආඥාපනත, වස විෂ අබිං හා අන්තරාදායක ඖෂධ ආඥාපනත, දුම්කොළ බදු පනතට අදාළව රාජකාරි කටයුතු ඉටු කිරීම, කාර්යාල පරිපාලනය හා අධීක්ෂණ රාජකාරි ඉටු කිරීම.

02. වැටුප් ප්‍රමාණය : RS 4 – 2025 රු.63,070-24 X 1190 – 91,630/- මාසික වැටුපක් මෙම තනතුරට අයත් වේ. (රා.ප.ව 10/2025ට අනුව)

03. වයස් සීමාව :

අයදුම්කරුවන් 2026.12.07 දිනට වයස අවු.21ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතු ය. (සුරාබදු දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත තනතුරු දරන උපාධිධාරීන් සඳහා වයස් සීමාවක් නොමැත.)

"ඒ අනුව 2005.12.07 දිනට හෝ ඊට පෙර හා 1991.12.07 දිනට හෝ ඊට පසු උපන්දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත."

04. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :

I. විශ්වවිද්‍යාල කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි ප්‍රදාන ආයතනයකින් ලත් උපාධියක් ලබා තිබීම.

II. ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන්ට අ.පොස. (සා.පෙළ) විභාගයේ දී සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

4.1 කායික සුදුසුකම් :

I. අවම උස (පාවහන් නොමැතිව) අඩි 5 අඟල් 06ක් විය යුතු ය. පපුවේ ඕනුම් ආශ්වාස නොකොට අඟල් 33ක් තිබිය යුතු ය.

II. උපැස් යුවලක් හෝ ස්පර්ශ කණ්ණාඩියක් (කන්ටැක් ලෙන්සර්) රහිතව භාණ්ඩ හැඳිනීමේ දෘෂ්ටිය ඇතුළුව අවම වශයෙන් 6/6 හා 6/12 වශයෙන් ඇස් පෙනීමකින් යුක්ත විය යුතු ය.

III. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

4.2 වෙනත් සුදුසුකම් :

I. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය.

II. අයදුම්කරුවන් යහපත් චරිතයකින් යුක්ත විය යුතු ය.

ප්‍රශ්න පත්‍රය	*කාලය*	*මුළු ලකුණු*	*සමන් ලකුණු*
01. අභියෝග්‍යතාව	පැය 01	100	40 %
02. පොදු ප්‍රශ්න පත්‍රය	පැය 01	100	40 %

ලිඛිත තරග විභාගය පිළිබඳ විස්තර :

විභාගය සඳහා වන විෂය නිර්දේශය

ප්‍රශ්න පත්‍රයේ නම	*විෂය නිර්දේශය*
01. අභියෝග්‍යතාව	ඉල්ලුම්කරුගේ බුද්ධිය, තර්කනය, තීරණ ගැනීමේ හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. (ගණිතය/ චිත්‍ර ගැටලු, සමාන/විරුද්ධ පද ලිවීම, වාක්‍යාංශ/වාක්‍ය සෑදීම, හිස්තැන් පිරවීම පිළිබඳ ප්‍රශ්න ද ඊට ඇතුළත් වෙනවා ඇත)
02. පොදු ප්‍රශ්න පත්‍රය	ශ්‍රී ලංකාවේ හා ලෝකයේ කාලීන හා සාමාජීය සිදුවීම් පිළිබඳව තොරතුරු හා සාමාන්‍ය දැනුම මැන බැලීම

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය - ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට යොමුකර ලිඛිත විභාගයෙන් හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගත් මුළු ලකුණුවල එකතුවේ කුසලතාවේ අනුපිළිවෙළ මත හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරුවලට බඳවා ගනු ලැබේ. එසේ වුව ද කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් නොපිරවීම සඳහා ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් තීරණය කළ හැකිය.

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී පහත සඳහන් සුදුසුකම් සඳහා ලකුණු ලබාදෙනු ලැබේ.

ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ	*උපරිම ලකුණු ප්‍රමාණය*
1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් පශ්චාත් උපාධිය, පශ්චාත් උපාධි ඩිප්ලෝමා, මූලික සුදුසුකමට අමතර උපාධියක් සඳහා සහ ප්‍රථම උපාධියේ පන්ති සාමාර්ථය අනුව	20
2. භාෂා හැකියාව	10
3. **ක්‍රීඩා කුසලතා** විවිධාකාරයේ ක්‍රීඩා සම්බන්ධයෙන් ජාතික, පළාත්, දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා පාසල් තරගවලදී දක්වන ලද වාර්තාගත දස්කම් සඳහා	35
4. වෙනත් කුසලතා **විශේෂිත පුහුණු** ශිෂ්‍යභට / ස්වේච්ඡා සේවය / ආත්මාරක්ෂක පුහුණු සටන් ක්‍රම හෝ තාක්ෂණ පුහුණුව **බාහිර ක්‍රියාකාරකම්**	30
5. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම්	05
එකතුව	**100**

05. සේවා කොන්දේසි :

I. රාජ්‍ය භාෂා නීතිය හා රජය විසින් වරින්වර පනවනු ලබන සියලුම නීති රෙගුලාසි අනුව ක්‍රියා කිරීමට බැඳී සිටිය යුතු ය.

II. 2310/29 හා 2022.12.14 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරන ලද කාර්යපටිපාටික රීතිවල I කාණ්ඩයේ III වැනි පරිච්ඡේදය VII වෙනි පරිච්ඡේදය හා VIII වෙනි පරිච්ඡේදය අදාළ වේ.

III. ශාරීරික සුදුසුකම් අයදුම්කරුවන් කෙරෙහි තිබෙදැයි ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙර පරීක්ෂා කරනු ලැබේ.

06. පුහුණු කාලය :

තෝරා ගනු ලබන අපේක්ෂකයන්ට මාස 03ක පුහුණුවක් ලබා දෙනු ලැබේ. මෙම කාලසීමාව අවසානයේ පවත්වනු ලබන පරීක්ෂණයකින් සමත් නොවන අයගේ පුහුණුව අවසන් කරනු ලැබේ. පුහුණු කාලය තුළ දී පුහුණුවන්නන්ට රු.20,000/-ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

07. පරිවාස කාලය:

සාර්ථක ලෙස පුහුණුව අවසන් කරන අපේක්ෂකයින් තුන් (03) අවුරුදු පරිවාස කාලයකට යටත්කොට සුරාබදු

පරීක්ෂක තනතුරට පත් කරනු ලැබේ. පරිවාස කාලය අවසානයේදී අනුමත බඳවා ගැනීමේ පටිපාටියට අනුව පවත්වන කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත් වුවහොත් අදාළ තනතුරේ ස්ථීර කරනු ලැබේ.

7.1 තමා වෙත පිරිනමන ලද තනතුරෙහි රාජකාරි නියමිත දිනයේදී භාර ගැනීමට අපොහොසත් වන හා / හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මහහරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කිරීමට, ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්ට බලය ඇත.

08. විභාග මාධ්‍ය :-

(*අ*) මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පැවැත් වේ.

(*ආ*) අපේක්ෂකයන් කැමති එක් භාෂා මාධ්‍යයකින් විභාගයට පෙනී සිටිය හැකි ය.

සටහන:

(i) අපේක්ෂකයන් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ එක් භාෂා මාධ්‍යයකින් පමණි.

(ii) අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන භාෂා මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

(iii) සෑම අපේක්ෂකයකුම ප්‍රශ්න පත්‍ර (02) ටම පෙනී සිටිය යුතු ය.

09. විභාග අයදුම්පත්:

මාර්ගගත (Online) විභාග අයදුම්පත් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිතා කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපෑල් (E-mail) ලිපිනයට හෝ දැනුම්දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instruction) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් නිවැරදිව පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. විභාග ගාස්තු රු.1,200/-කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම් සිදු කළ යුතු ය.

I. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Cards);

II. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Dedit Card with the Facility of Internet Transactions);

III. ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය/ Flex යෙදවුම මගින් (Online Banking Method/ Flex App of Bank of Ceylon);

IV. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Bank of Ceylon Teller Slip Payment).

සටහන:

(*අ*) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(*ආ*) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තු සඳහාවන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(*ඇ*) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

11. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මගින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමුකර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත්

වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතු ය. විභාග ශාලාවේ දී/ සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

12. විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සැහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

(අ) ජාතික හැඳුනුම්පත
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(ඇ) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් ඝන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

13. විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය.

14. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට සිදුවේ.

15. පත්වීම් බලධාරියා විසින් ප්‍රතිඵල නිකුත් කිරීමට සුදුසු දිනය දන්වා එවූ පසු ලිඛිත විභාගයෙන් එක් එක් විෂයයට ලබා ගත් ලකුණු/ මුළු ලකුණු සඳහන් කළ ප්‍රතිඵල සටහනක් විභාගයට ඉදිරිපත් වූ සියලුම අයදුම්කරුවන් වෙත තැපැල් මඟින් යැවීමට හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය හරහා ප්‍රතිඵල නිකුත් කිරීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පියවර ගනු ඇත. **විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.**

16. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

එම්.බී.එන්.ඒ.පේමරත්න,
සුරාබදු කොමසාරිස් ජනරාල්.

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව,
අංක 353, කෝට්ටේ පාර,
රාජගිරිය.

11 - 72

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III වන ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම සඳහා පුරප්පාඩු ප්‍රසිද්ධ කිරීම - 2025/2026

Publishing of Vacancies for the Recruitment of the officers to the Grade **III** of the Sri Lanka Principals Service - 2025/2026

අංක 2,463 හා 2025.11.14 දිනැති *රජයේ ගැසට් පත්‍රයේ* පළකරන ලද "ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය - 2025" *ගැසට් නිවේදනයේ* විධිවිධාන පරිදි 2026.06.07 දින පවත්වන ලද ලිඛිත තරග විභාගයේ හා ඉදිරියේ දී පැවැත්වීමට නියමිත සම්මුඛ පරීක්ෂණවල ප්‍රතිඵල මත පදනම්ව පහත දැක්වෙන දිස්ත්‍රික්කයන්හි රජයේ පාසල්වල (ජාතික හා පළාත් පාසල්) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ අනුමත තනතුරුවල 2026.10.05 දිනට පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා නව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

අනු. අංකය	*දිස්ත්‍රික්කය*	*ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ පුරප්පාඩු සංඛ්‍යාව*	
		සිංහල මාධ්‍ය	*දෙමළ මාධ්‍ය*
01	කොළඹ	55	2
02	ගම්පහ	234	16
03	කළුතර	95	56
04	මහනුවර	2	106

අනු. අංකය	දිස්ත්‍රික්කය	ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ පුරප්පාඩු සංඛ්‍යාව	
		සිංහල මාධ්‍ය	දෙමළ මාධ්‍ය
05	මාතලේ	126	52
06	නුවරඑළිය	65	136
07	ගාල්ල	213	17
08	මාතර	105	17
09	හම්බන්තොට	193	6
10	යාපනය	නැත	97
11	කිළිනොච්චිය	නැත	33
12	මන්නාරම	1	60
13	වවුනියාව	7	52
14	මුලතිව්	7	49
15	මඩකලපුව	නැත	335
16	අම්පාර	61	55
17	කුරුණෑගල	351	54
18	ත්‍රිකුණාමලය	68	174
19	පුත්තලම	258	103
20	අනුරාධපුර	184	47
21	පොළොන්නරුව	156	24
22	බදුල්ල	90	68
23	මොණරාගල	214	11
24	රත්නපුර	343	73
25	කෑගල්ල	211	74

ඒ ඒ දිස්ත්‍රික්කයන්හි එක් එක් භාෂා මාධ්‍ය යටතේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර සුදුසුකම්ලාභීන්ගේ නම් ලැයිස්තුව සම්මුඛ පරීක්ෂණ පැවැත්වෙන ස්ථානය, වේලාව හා සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ලේඛන පිළිබඳව ඉදිරි කාලයේ දී අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ වෙබ් පිටුවෙහි පළ කරනු ලැබේ.

සුදුසුකම්ලාභීන්ගේ නම් ලැයිස්තුවෙහි ඔබගේ නම සඳහන්කර ඇත්නම්, ඔබ විසින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් විය යුතු අතර මේ සම්බන්ධයෙන් ඔබ වෙත ලිපියකින් ද දැනුම් දීමට කටයුතු කරනු ඇත.

කෙසේ වුව ද, අදාළ ලිපිය නොලැබුණ ද ඔබගේ අනන්‍යතාවය තහවුරු කිරීමෙන් අනතුරුව නියමිත දිනයේ දී ඔබට සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටීමට අවස්ථාව ලබාදෙනු ඇත.

සිංහල,දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් පළකරනු ලබන මෙම *ගැසට්නිවේදනයේ* භාෂා පාඨ අතර යම්කිසි අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල භාෂා මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

නාලක කලුවැව,
ලේකම්,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය.

11-102

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමණාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩය - 02 සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය - (MT 02-) යටතේ දුම්රිය තාක්ෂණ කළමනාකරණ සහකාර (යාන්ත්‍රික) තනතුරුවල III වන ශ්‍රේණියට විවෘත පදනමින් බඳවා ගැනීම සඳහා වන පුහුණු කාලයට බඳවා ගැනීම - 2026.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2017.06.15 දිනැතිව අනුමත කරන ලද ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමණාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩය - 02 සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය - (MT -02) හා එයට සිදු කර ඇති සංශෝධන ප්‍රකාරව ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය තාක්ෂණ කළමනාකරණ සහකාර (යාන්ත්‍රික) III වන ශ්‍රේණියේ තනතුරුවලට විවෘත පදනමින් බඳවා ගැනීම සඳහා වන පුහුණු කාලයට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2026. 12. 07 දින වේ.

2). මෙම විවෘත තරග විභාගය මගින් බඳවා ගැනීම සිදු කරනුයේ කළමණාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩය - 02 සේවා ගණයේ - (MT -02) දුම්රිය තාක්ෂණ කළමනාකරණ සහකාර (යාන්ත්‍රික) තනතුරේ පුරප්පාඩු 80 ක් සඳහා වේ.

සටහන - 1 :

දුම්රිය තාක්ෂණ කළමනාකරණ සහකාර (යාන්ත්‍රික) තනතුරට ඉල්ලුම්කරු විසින් හදාරා ඇති පාඨමාලාවට අදාළ වන පරිදි පහත ක්ෂේත්‍ර සඳහා බඳවා ගැනීම සිදු කෙරේ.

- සාමන්‍ය වැද්දුම්කරු
- ඩීසල් වැද්දුම්කරු
- යාන්ත්‍රික වැද්දුම්කරු
- මැෂින්කරු
- පැස්සුම්කරු
- ගෑස් කපන්නා
- තහඩුකරු
- බොයිලේරු සාදන්නා /බොයිලේරු වැද්දුම්කරු
- මෝටර් කාර්මික

3). **පුහුණු කාල සීමාවට බඳවා ගැනීම සඳහා සුදුසුකම් :**

3.1 **අධ්‍යාපන සුදුසුකම් :**

(a.) සිංහල/දෙමළ/ඉංග්‍රිසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමර්ථ්‍යයන් සහිතව එක් වරක දී විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා/පෙළ) විභාගය සමත් වී තිබීම;

සහ

(b.) අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (උසස්පෙළ) විභාගයේ දී භෞතික විද්‍යා/තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ සියලුම විෂයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

සටහන -2

2017.06.15 දින වන විට ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස ආයතනයේ පුහුණු පාඨමාලා සඳහා ඇතුළත් කරගෙන ඇති පුහුණුලාභීන් සඳහා පමණක් අදාළ පාඨමාලා සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ලබා දෙනු ලබන පුහුණු සහතිකය ලබා ඇත්නම් ඉහත 3) අධ්‍යාපන සුදුසුකම් නොසලකා අයදුම් කිරීමට අවස්ථාව ලබා දෙනු ලැබේ.

3.2 **වෘත්තිය සුදුසුකම් :**

බඳවා ගනු ලබන ශ්‍රේණිය	*වෘත්තිය සුදුසුකම්*	*පුහුණු කාලය*
දුම්රිය තාක්ෂණ කළමනාකරණ සහකාර (යාන්ත්‍රික) පුහුණු කාල සීමාව	ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස ආයතනයෙන් තනතුරට අදාළ ක්ෂේත්‍රයක (සටහන 1 හි අඩංගු ක්ෂේත්‍රවලට අදාළව) වසර 2 ½ කට නොඅඩු පූර්ණ කාලීන කාර්මික පාඨමාලාවක් හදාරා සහතික පත්‍ර ලබා තිබීම; *හෝ* තෘතියික හා වෘත්තීය පුහුණු අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ක්ෂේත්‍රයට අදාළව (සටහන 1 හි අඩංගු ක්ෂේත්‍රවළට අදාළව) වසර දෙක හමාරකට (2 ½) නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික පත්‍ර ලබා තිබීම.	අවුරුදු 01

සටහන -2

බඳවා ගැනීම් සිදු කිරීමේදී ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස ආයතනයේ පුහුණුලාභීන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන අතර ඔවුන් බඳවා ගැනීමෙන් අනතුරුව ඉතිරිවන පුරප්පාඩු සඳහා අනෙකුත් ආයතන වලින් කාර්මික පාඨමාලා හදාරා සහතික පත්‍ර ලබා ඇති අයගෙන් බඳවා ගනු ලැබේ.

4.3 **පළපුරුද්ද :**

තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද විශේෂ සුදුසුකමක් සේ සැලකේ.

4.4 **කායික සුදුසුකම් :**

I. සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු අතර, දුම්රිය රෙගුලාසි මාලාවේ දක්වා ඇති අක්ෂි දෘෂ්ටියක් සහිත විය යුතු ය.

4.5 **වෙනත් සුදුසුකම් :**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
ii. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.
iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ *ගැසට් පත්‍රයේ* / වෙබ් අඩවියේ සඳහන් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු යි.

4.6 **වයස් සීමාව :**

(a) අයදුම්පත් කැඳවීමේ අවසන් දිනයට අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතු ය.

5). **බඳවා ගැනීමේ ක්‍රමවේදය :**

නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ලිඛිත තරග විභාගයකයට හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකට යොමු කර ලිඛිත තරග විභාගයේ සහ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් ලකුණුවල එකතුව අනුව වැඩිම ලකුණු ලැබූ අයගේ කුසලතා අනුපිළිවෙළ අනුව හා පවතින පුරප්පාඩු ප්‍රමාණය අනුව ප්‍රථමයෙන් වසරක පුහුණු කාල සීමාවකට බඳවා ගනු ලබයි. සම ලකුණු ලබාගත් අයදුම්කරුවන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවක දී එම පුරප්පාඩුව පිරවීම පිළිබඳ තීරණය කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 92 වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය වේ.

පුහුණුව අවසානයේ ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයකට යොමු කර සමත් වූ අය දුම්රිය තාක්ෂණ කළමනාකරණ සහකාර (යාන්ත්‍රික) තනතුරේ III වන ශ්‍රේණියට පත්කරනු ලැබේ. පළමුවර පුහුණුව අවසන් පරීක්ෂණය අසමත් වූ අයට, නැවත පැවැත්වෙන පුහුණුව අවසන් පරීක්ෂණය සඳහා පෙනී සිටීමට අවස්ථා 02 ක් ලබාදෙන අතර, ඉන් අසමත් වන අයගේ සේවය අවසන් කරනු ලැබේ.

6). **වැටුප් පරිමාණය :**

පුහුණු කාල සීමාවෙන් පසු III ශ්‍රේණිය සඳහා

මෙම තනතුරුවලට අදාළව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි උපලේඛන 1 අනුව අදාළ වැටුප් පරිමාණය (MT-02-2025) රු.50,630-10X630-11X670-10X1,010-10X1,190-86,300/- වේ. ඔබට වැටුප් ගෙවනුයේ එම චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව එහි උපලේඛන හි 111 සඳහන් පරිදි වේ.මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද ඔබට හිමි වේ.

පුහුණු කාල සීමාව සඳහා මාසික දීමනාව-2026.01.01 දින සිට 2026.12.31 දක්වා මාසික දීමනාව- රු. 41,209/-කි. 2027.01.01 දින සිට 42,780/- කි) .

7). **විභාග ගාස්තුව :**

මෙම විභාගය දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් නියම කරන ලද ආයතනයක් මඟින් පවත්වනු ලැබේ. විභාග ගාස්තුව රු. 1,200/= කි. විභාග ගාස්තුව දුම්රිය සාමාන්‍යාධිකාරිගේ මහජන බැංකු නගර මධ්‍ය ශාඛාවේ ගිණුම් අංක 176-100129027-313 ට බැර වන ලෙස අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර දිවයිනේ පිහිටි ඕනෑම මහජන බැංකු ශාඛාවකට ගෙවා අයදුම්කරුගේ නමින්ම ලබා ගන්නා රිසිට් පත ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැළවෙන සේ අලවන්න. එම රිසිට්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

1. විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලබන අතර මුදල් ඇණවුම් හා මුද්දර භාර ගනු නොලැබේ.
2. විභාගය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

8). **අයදුම් කිරීමේ ක්‍රමය :**

(*අ*) අයදුම්පත මෙම නිවේදනයේ අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු ය. එය කඩදාසිය දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් සෙ.මී.29.5 X 21 ප්‍රමාණයේ A 4 කඩදාසියක සකස්කර තම අත් අකුරින් පිරවිය යුතු ය. අංක 01 සිට 2.11 තෙක් ශීර්ෂ පළමු වන පිටුවට ද ඉතිරිය අනෙක් පිටුවලට ද වන ලෙස ගෙන අයදුම්පත සකස් කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතු ය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද/ යතුරු ලියනය

කරන ලද අයදුම්පත් ද භාවිත කළ හැකිය. සම්පූර්ණ කරනු ලැබූ අයදුම්පත කැඳවීම් නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතියට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු ය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එබැවින් අයදුම්පත යොමු කිරීමට පෙර එය කැඳවීම් නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කර තිබේ ද යන්න පිළිබඳවත් නැවත විමසිලිමත් විය යුතු ය.

(*ආ*) අයදුම්පත පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහල භාෂාවට අමතරව, ඉංග්‍රීසි භාෂාවෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද යෙදීම අත්‍යවශ්‍ය වේ.

(*ඇ*) අයදුම්පත දුම්රිය සාමාන්‍යාධිකාරිගේ හෝ දුම්රිය දෙපාර්තමේන්තුවේ අන්‍ය නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොඑවිය යුතු ය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 02 සේවා ගණයේ දුම්රිය තාක්ෂණ කළමනාකරණ සහකාර (යාන්ත්‍රික) 111 ශ්‍රේණියේ තනතුරුවලට විවෘත පදනම මත බඳවා ගැනීම සඳහා වන පුහුණු කාලයට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය 2026 "**යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

(*ඉ*) **අයදුම්පත් 2026.12.07 වැනි දිනට** හෝ ඊට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

දුම්රිය සාමාන්‍යාධිකාරි,
දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලය,
තැ.පෙ.355,
ඕල්කට් මාවත,
කොළඹ 10.

(*ඊ*) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

9) විභාගයට ඇතුළුවීම :

(*අ*) මෙම ලිඛිත විභාගය පවත්වනු ලබන්නේ දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් නියම කරන ලද ආයතනයක් විසිනි. *ගැසට්* නිවේදනයේ සඳහන් සියලුම සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන්ට පමණක් එම අදාළ ආයතනය විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(*ආ*) අයදුම්කරුවකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතු ය. සෑම අයදුම්කරුවකුම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය අත්සන සහතික කරවා ගෙන පළමුවෙන් එම ශාලාවේ පෙනී සිටින දින එහි ශාලාධිපති වෙත භාර දිය යුතු ය. අයදුම්කරු තම අයදුම්පත්‍රයේ සඳහන් කළ ජාතික හැඳුනුම්පත් අංකයම විභාග ශාලාවේදී ද යෙදිය යුතු වන අතර, යම් හෙයකින් වෙනත් අංකයක් ඇතුළත් කර තිබුණහොත් එම අයදුම්කරුගේ ප්‍රතිඵල අත්හිටවනු ලැබේ. සෑම අයදුම්කරුවකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රයේ* පළ කර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාගය පවත්වන ලද ආයතනය විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අයදුම්කරුවන් යටත්වේ. එම නීති උල්ලංඝනය කළහොත් අදාළ ආයතනය විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට සිදුවනු ඇත.

(*ඇ*) අත්සන සහතික කිරීම :

අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසල් ප්‍රධානියෙකු/ විශ්‍රාමික නිලධාරියෙකු / කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයා/ සාමදාන විනිශ්චයකාරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/ නීතිඥවරයෙකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියෙකු/රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු/ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති/ නායක ස්වාමීන් වහන්සේ නමක්/ අන්‍ය ආගමික පූජස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයකු ලවා සහතික කරවා ගත යුතු ය.

සටහන 3:- අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

10) අයදුම්කරුගේ අනන්‍යතාව :

අපේක්ෂකයන් විසින් තමන් ඉදිරිපත් වන එක් එක් විෂයය සඳහා විභාග ශාලාධිපති වෙත තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ලේඛනවලින් එකක් පමණක් පිළිගනු ලැබේ.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත;
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

11) සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම :

i. මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර හෝ අවස්ථාවක දී වුව ද ඇයගේ හෝ ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

ii. අපේක්ෂකයකු විසින් සපයනු ලබන තොරතුරු පසු කලෙක දී වැරදි බව පෙනී ගියහොත් ඔහු හෝ ඇය විසින් හිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙළිවුවහොත් හෝ ඔහු හෝ ඇය වෙත පත්වීමක් ලබා දීම සම්බන්ධයෙන් තවදුරටත් සලකා බලනු නොලබන අතර, මෙම විභාගය හේතු කොටගෙන දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහ කිරීමට වුව ද යටත් වේ.

12) විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය :

මෙම විභාගය දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් නියම කරන ලද ආයතනයක් මඟින් කොළඹ දී පමණක් පැවැත්වේ.

12.1 ලිඛිත විභාග මාධ්‍යය -

I. විභාගය සිංහල හා දෙමළ යන භාෂා මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.

සටහන :
a. අයදුම්කරුවකු විභාගයේ දී පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයකට ම එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතු ය.
b. තම අයදුම්පතෙහි සඳහන් විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අයදුම්කරුවකුට අවසර දෙනු නොලැබේ.

12.2 ලිඛිත විභාග ප්‍රතිඵල :

I. ලිඛිත විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාගය පවත්වනු ලබන ආයතනය විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ.

12.3 ලිඛිත විභාගය පිළිබඳ විස්තර

I. **පුහුණු කාලසීමාවට බඳවා ගැනීම සඳහා වන ලිඛිත විභාගය :**

විෂයය	*කාලය*	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත් ලකුණු ප්‍රමාණය*
සාමාන්‍ය දැනීම බුද්ධි පරීක්ෂණය	පැය 01	100	40%
තාක්ෂණ විෂය	පැය 02	100	40%

12.4 ලිඛිත විභාගයේ විෂය නිර්දේශය :

★. **සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය**

අපේක්ෂකයා වාසය කරන හා සේවය කරන පරිසරය ඇතුළුව ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, සංස්කෘතික හා දේශපාලනමය දැනුම හා ජාතික හා අන්තර්ජාතික වශයෙන් වැදගත් වන නූතන කරුණු මෙන්ම ඓතිහාසික කරුණු ද, විද්‍යාත්මක, භෞතික හා අපේක්ෂකයාගේ තර්කානුකූල විවරණ සහ විග්‍රහ ශක්තිය, නිවැරදි සිද්ධි අනුමානයන්ට එළඹීමේ හැකියාව,සාමාන්‍ය දැනීම හා පරිසරය ආශ්‍රිත ප්‍රශ්න ඇතුළත් ව්‍යුහගත මාදිලියේ ලිඛිත විභාගයකි.

★. තාක්ෂණ විෂය

තනතුරට අදාළව දැනගත යුතු මූලික තාක්ෂණික න්‍යායික දැනුම මැන බැලෙන ආකාරයේ ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ.

13) යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :

ලිඛිත තරග විභාගයෙන් සමත්වන අයදුම්කරුවන් ලබාගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු සංඛ්‍යාවේ දෙගුණයකට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක්

යෝග්‍යතා ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණයට යොමු කර ලිඛිත විභාගයෙන් හා යෝග්‍යතා ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව අයදුම්පත් කැඳවන අවස්ථාවේ පැවැති පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගනු ලැබේ. (ඇමුණුම 1 අනුව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දේ)

14). පුහුණු කාලසීමාවෙන් පසු III ශ්‍රේණියට බඳවා ගැනීමේ ලිඛිත විභාගයේ හා ප්‍රායෝගික පරීක්ෂණය

14.1 පුහුණු කාල සීමාවෙන් පසු III ශ්‍රේණියට බඳවා ගැනීමේ ලිඛිත විභාගයේ විෂයයන්

විෂයය	*කාලය*	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත් ලකුණු ප්‍රමාණය*
තාක්ෂණ විෂයය	පැය 02	100	40%

විෂය නිර්දේශය

තාක්ෂණ විෂයය : තනතුරට අදාළව දැනගත යුතු මූලික තාක්ෂණ දැනුම මැන බැලෙන ආකාරයේ ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ.

14.2 **පුහුණු කාලසීමාවෙන් පසු III ශ්‍රේණියට බඳවා ගැනීමේ ප්‍රායෝගික පරීක්ෂණය :**

විෂයය	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත් ලකුණු ප්‍රමාණය*
තාක්ෂණ විෂය	100	40%

විෂය නිර්දේශය :

තාක්ෂණ විෂයය : තෝරාගත් විෂය පිළිබඳ නිපුණතාවය මැන බැලීම සඳහා තනතුරට අදාළව න්‍යායික දැනුම ප්‍රායෝගිකව හා නිවැරදිව භාවිතයට ගනු ලබන්නේදැයි මැන බැලීම සඳහා ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

15. සේවා කොන්දේසි :

මෙම තනතුර ස්ථීරය. විශ්‍රාම වැටුප් සහිතය.

15.1 සේවා ගිවිසුම පිළිබඳ විස්තර :

පුහුණු කාලසීමාවකට බඳවා ගෙන 111 ශ්‍රේණියට පත් කරනු ලබන නිලධාරීන් 111 ශ්‍රේණියට පත් වීම් ලද දින සිට වසර 10 ක කාලයක් අනිවාර්යයෙන්ම දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවය කළ යුතු ය. එසේ වසර 10 සේවයට පෙර ඉවත්ව නොයන බවටත් ඊට පෙර සේවයෙන් ඉවත්ව යන්නේ නම් දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් නිර්දේශ කරනු ලබන මුදලක් දෙපාර්තමේන්තුවට ගෙවීමට එකඟ බවටත් රජයේ සේවකයෙකු ඇප කරුවෙකු වශයෙන් ඉදිරිපත්කර වගකීමකට බැඳිය යුතු ය.

III ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ගතවීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

15.2 රාජ්‍ය භාෂාව :

රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතු ය.

අනෙක් රාජ්‍ය භාෂාව: රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 සහ ඊට අනුෂාංගික චක්‍රලේඛ විධිවිධාන අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාව ලබා ගත යුතු ය.

තෝරා ගනු ලබන්නන් රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩ-02 සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම පටිපාටියට කර ඇති හෝ මින් මතු කරන සංශෝධනවලට ද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ විධිවිධානවලට ද, දෙපාර්තමේන්තු නියෝග හා රෙගුලාසිවලටද යටත් විය යුතු ය.

තෝරා ගනු ලබන්නන් නියමිත වෛද්‍ය පරීක්ෂණයෙන් සමත්වීමට අමතරව දුම්රිය දෙපාර්තමේන්තුවේ උපදෙස් මාලාවට අනුව තනතුරට අදාළව සමත්විය යුතු විශේෂ දෘෂ්ඨි පරීක්ෂණයෙන් ද සමත් විය යුතු ය.

16). සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර, කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

17). කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට ද මෙහි රෙගුලාසි සලසා නොමැති කරුණු පිළිබඳව තීරණ ගැනීමට ද දුම්රිය සාමාන්‍යාධිකාරීට බලය ඇත.

රවින්ද්‍ර පත්මප්‍රිය,
දුම්රිය සාමාන්‍යාධිකාරි.

2026 නොවැම්බර් මස 02 වන දින,
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව ,
ඕල්කට් මාවත, තැ.පෙ. 355,
කොළඹ 10.

දුම්රිය තාක්ෂණ කළමනාකරණ සහකාර යාන්ත්‍රික තනතුරේ පුහුණු කාලසීමාවට බඳවා ගැනීමේ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය - 2026

ඇමුණුම- 1

අනු. අංකය	*ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර*	*සලකා බැලෙන උප ක්ෂේත්‍ර*		*ලබා දෙන ලකුණු ප්‍රමාණය*	*උපරිම ලකුණු ප්‍රමාණය*
1	අතිරේක අධ්‍යාපන සුදුසුකම්	අ.පො.ස. උසස් පෙළ ඉංග්‍රීසි භාෂාව සඳහා	සාමාන්‍ය සාමාර්ථයක් සඳහා ලකුණු 2 ක් හා සම්මාන හෝ ඊට ඉහළ සාමාර්ථ සඳහා ලකුණු 5ක් වන සේ ලකුණු ලබා දිය යුතු ය.)	5	20
		ඉංග්‍රීසි භාෂාව සම්බන්ධව ලබා ඇති සහතිකපත්‍ර/ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා	පිළිගත් ආයතනයකින් ලබා ඇති සහතික පත්‍ර /ඩිප්ලෝමා පාඨමාලා සඳහා (මාස 6 ට අඩු සහතික පත්‍ර පාඨමාලාවකට ලකුණු 2 ක් සහ මාස 6 ට වැඩි ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා ලකුණු 5 ක් බැගින් උපරිම ළකුණු 5 කට සීමා වන සේ ලකුණු ලබා දිය යුතු ය.)	5	
		පරිගණක හැකියාව සම්බන්ධයෙන් ලබා ඇති සහතිකපත්‍ර/ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා		5	
		වෙනත් භාෂාවක් සම්බන්ධයෙන් ලබා ඇති සහතිකපත්‍ර/ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා		5	
2	අතිරේක වෘත්තීය සුදුසුකම්	තනතුරට අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති නිපුණතාවය පිළිබඳ සලකා බලනු ලැබේ. (මූලික වෘත්තීය සුදුසුකම් සඳහා ලකුණු ලබා දීමක් සිදු නොවේ.)			
		පිළිගත් ආයතනයකින් ක්ෂේත්‍රයට අදාළව ලබා ගත් මාස 6 ක සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා		10	30
		පිළිගත් ආයතනයකින් ක්ෂේත්‍රයට අදාළව ලබා ගත් වසර 1 ක ඩිප්ලෝමා පාඨමාලාවන් සඳහා		20	
		පිළිගත් ආයතනයකින් ක්ෂේත්‍රයට අදාළව ලබා ගත් වසර 1 ට වැඩි පාඨමාලාවන් සඳහා		30	

අනු. අංකය	*ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර*	*සලකා බැලෙන උප ක්ෂේත්‍ර*		*ලබා දෙන ලකුණු ප්‍රමාණය*	*උපරිම ලකුණු ප්‍රමාණය*
3	තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද	තනතුරට අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද සලකා බලනු ලැබේ.			
		සේවා පළපුරුද්ද වසර 03 හෝ ඊට වැඩි නම් එක් සේවා සහතිකයකට ලකුණු 15 බැගින් සේවා සහතික දෙකක් (2) සඳහා		30	30
		සේවා පළපුරුද්ද වසර 02 හෝ ඊට වැඩි හා 03 ට අඩු නම් එක් සේවා සහතිකයකට ලකුණු 10 බැගින් සේවා සහතික දෙකක් (2) සඳහා		20	
		සේවා පළපුරුද්ද වසර 01 හෝ ඊට වැඩි හා 02 ට අඩු නම් එක් සේවා සහතිකයකට ලකුණු 5 බැගින් සේවා සහතික දෙකක් (2) සඳහා		10	
		සේවා පළපුරුද්ද මාස 06 හෝ ඊට වැඩි හා වසර 01 ට අඩු නම් එක් සේවා සහතිකයකට ලකුණු 2.5බැගින් සේවා සහතික දෙකක් (2) සඳහා		5	
4	විශේෂ/බාහිර දක්ෂතා	ක්‍රීඩා/ශිෂ්‍යභට ආදී කුසලතා සම්බන්ධයෙන් ලබා ඇති පිළිගත හැකි සහතික එකකට ලකුණු 03 බැගින් (උපරිම සහතික 03 ක් සඳහා)		9	15
		සෞන්දර්ය කුසලතා සම්බන්ධයෙන් ලබා ඇති පිළිගත හැකි සහතික එකක් සඳහා ලකුණු 1 බැගින් (උපරිම සහතික 02 ක් සඳහා)		2	
		සමාජ සේවා කටයුතු සම්බන්ධයෙන් සහතික/දහම් පාසල් තරඟ විභාග සහතික එකක් සඳහා ලකුණු 1 බැගින් (උපරිම සහතික 02 ක් සඳහා)		2	
		ඉහත ලකුණු සඳහා ඉදිරිපත් කර නොමැති වෙනත් බාහිර කුසලතාවක් සම්බන්ධයෙන් ලබා ඇති පිළිගත හැකි සහතික එකක් සඳහා ලකුණු 1 බැගින් (උපරිම සහතික 02 ක් සඳහා)		2	
5	සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ආකල්ප හා පෞරුෂය	නායකත්වය		2	5
		පෞරුෂය		2	
		සන්නිවේදන කුසලතා		1	
එකතුව					**100**

ඇමුණුම II

ආදර්ශ අයදුම්පත

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩය - 02 සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය - (MT -02) යටතේ දුම්රිය තාක්ෂණ කළමනාකරණ සහකාර (යාන්ත්‍රික) තනතුරු වල III වන ශ්‍රේණියට විවෘත පදනමින් බඳවා ගැනීම සඳහා වන පුහුණු කාලයට බඳවා ගැනීම - 2026

1. මාධ්‍යය:විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය:

සිංහල - 2, දෙමළ - 3,

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
අයදුම්පත සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත්වන භාෂා මාධ්‍යයෙනි.

2. **පෞද්ගලික තොරතුරු:**

2.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
.....
(උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDANE)

2.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම් වල මුලකුරු පසුව ද යොදා නම:
.....
(උදා : GUNAWARDANE , H.M.S.K) :

2.3 සම්පූර්ණ නම: (සිංහලෙන් / දෙමළෙන්):
.....

2.4. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
.....
(ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.) :

2.5 ස්ත්‍රී / පුරුෂ භාවය : පුරුෂ -0, ස්ත්‍රී -1 අදාළ අංකය කොටුව තුළ ලියන්න

2.6 ජාතික හැඳුනුම්පත් අංකය:

2.7 ජංගම දුරකථන අංකය:

2.8 විවාහක / අවිවාහක බව : විවාහක-1, අවිවාහක -2

2.9 ජන වර්ගය : සිංහල -1, මුස්ලිම් - 4, දෙමළ - 2, වෙනත් - 5, ඉන්දියන් දෙමළ - 3

2.10 උපන් දිනය : වර්ෂය : මාසය : දිනය :

2.11. අයදුම්පත් කැඳවීමේ දිනට වයස : වර්ෂ : මාස : දින :

3. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :

3.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ ප්‍රතිඵල විස්තරය :

3.1.1 විභාග අංකය:.....

3.1.2 විභාගයට පෙනී සිටි වසර:.....

විෂයය	*සාමාර්ථය*

3.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල විස්තරය :

3.2.1 විභාග අංකය:.....

3.2.2 විභාගයට පෙනී සිටි වසර:.....

විෂයය	*සාමාර්ථය*

3.3 තෘතික හා වෘත්තිය කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හදාරා ඇති පාඨමාලාවේ නම:
.....

පාඨමාලාවේ කාලය: වසර

..... දින සිට ..... දක්වා

4. මුදල් ගෙවූ තැන්පතු පත්‍රිකාවේ පිටපත මනා ලෙස අලවන්න.

5. **අයදුම්කරුගේ සහතිකය :**

ගැසට් නිවේදනයේ සඳහන් සියලුම නීති රෙගුලාසි ප්‍රකාරව විවෘත තරග විභාගයට පෙනී සිටීමට මා සුදුස්සකු බවත්, මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත් ප්‍රකාශ කරමි. විභාග නීති රීතිවලට එකඟව ක්‍රියා කිරීමටත් මෙම විභාගය පිළිබඳ විධිවිධාන ඇතුළත් බඳවා ගැනීම් පටිපාටිය අනුව මා නුසුදුස්සකු බව පෙනී ගිය හොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම සම්බන්ධයෙන් මම එකඟ වෙමි. තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාගය පවත්වනු ලබන ආයතනය විසින් පනවනු ලබන නීති රීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

....,
දිනය. අයදුම්කරුගේ අත්සන.

6. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම. (*ගැසට් නිවේදනයේ* 9 (ඇ) පරිදි විය යුතුය.)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ..... (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත් නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත් එම ලදුපත අලවා ඇති බවත්..... දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මා සහතික කරමි.

.....,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය: .....

අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :.....
තනතුර : .....
ලිපිනය : .....
(නිල මුද්‍රාව)

7. ආයතන ප්‍රධානියාගේ සහතිකය : (රාජ්‍ය/පළාත් රාජ්‍ය/රාජ්‍ය සංස්ථා සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි)
මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන .....මයා/මිය/මෙනවිය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ආයතනයේ .....ලෙස සේවය කරන අතර ඔහුගේ /ඇයගේ අයදුම්පත්‍රය නිර්දේශකර ඉදිරිපත් කරමි. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයෙන් සේවයෙන් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ හැකිය.

.....,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :.....
පදවි නාමය : .....
දිනය : .....
(නිල මුද්‍රාව)

තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය

ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය

ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව - 2026/2027

තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය මගින් සිංහල හා ඉංග්‍රීසි භාෂාවෙන් පවත්වනු ලබන NVQ 5 මට්ටමේ ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා වයස අවුරුදු 18-35 (රජයේ සේවයේ නියුක්ත ව සිටින්නන්ට වයස් සීමාව 45 ට නොවැඩි විය යුතු ය. අමතර සුදුසුකම් ලද අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :

1.1 අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) පරීක්ෂණයේ දී සිංහල/ දෙමළ භාෂාව සහ ගණිතය/ අංක ගණිතය ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06න් සම්මාන 03ක් සහිතව සමත් විය යුතු ය. තව ද, ඔහු හෝ ඇය,

(අ) පිළිගත් ක්‍රීඩා හෝ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ පාසලක යටත් පිරිසෙන් මාස 06 පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම;

හෝ

(ආ) ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ හෝ සිවිල් ආරක්ෂක අංශයේ පුහුණු කිරීමේ ආයතනයක, පාසලක ක්‍රීඩා හෝ ශාරීරික අධ්‍යාපනය පිළිබ පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම;

හෝ

(ඇ) පාසල් ක්‍රීඩා ගුරුවරයෙකු හෝ ගුරුවරියක් වශයෙන් හෝ පළාත් පාලන ආයතනයක ක්‍රීඩා භූමි උපදේශකවරයෙකු හෝ උපදේශකවරියක් වශයෙන් හෝ යටත් පිරිසෙන් වසර 05ක පළපුරුද්දක් සහිතව ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශේෂ දක්ෂතාවයක් දක්වා තිබීම;

හෝ

(ඈ) කිසියම් ක්‍රීඩාවක් සම්බන්ධයෙන් ජාතික ක්‍රීඩා කණ්ඩායමක සාමාජිකයෙකු විය යුතු අතර කිසියම් ජාත්‍යන්තර තරගයකට සහභාගී වී තිබීම;

හෝ

(ඉ) ක්‍රීඩා අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන ජාතික මහා ක්‍රීඩා උළෙලේ ද්ස්ත්‍රික්ක මට්ටමේ තරගයක දී ප්‍රථම හෝ දෙවන ස්ථානය ලබා තිබීම. එසේ නැතහොත් ජාතික ක්‍රීඩා සංගමයකින් පවත්වනු ලබන ජාතික මට්ටමේ තරගයක දී ප්‍රථම, දෙවන හෝ තෙවන ස්ථානය ලබා තිබිය යුතු ය.

1.2. ආදර්ශ අයදුම්පත හා නොගැලපෙන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2. අයදුම්පත් එවීමේ ක්‍රමය :

2.1 ඉහත සඳහන් අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් හෝ අපේක්ෂිකාවන් විසින් මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය පරිදි "8x13$^{1}/_{3}$" ප්‍රමාණයේ කඩදාසියක සකස් කරගත් අයදුම්පත් තම අත් අකුරින් සම්පූර්ණ කර **2026.12.01 වන දිනට පෙර අධ්‍යක්ෂ, ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය, අංක 100/7, නිදහස් මාවත, කොළඹ 07** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නියමිත ආකෘතිය ප්‍රකාර ව සම්පූර්ණ නො කරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2.2 අයදුම්පත් බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ **"2026/2027 ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම්පත"** යනුවෙන් සඳහන් කර එවිය යුතු ය.

2.3 රජයේ සේවය, පළාත් රාජ්‍ය සේවය සහ සංස්ථාවල සේවයේ නියුතු නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතු ය. එසේ නොවන අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. තෝරා ගැනීම :

මෙම පාඨමාලාව සඳහා ලැබෙන අයදුම්පත් අතරින් සුදුසුකම් සම්පූර්ණ කර ඇති සියලු දෙනා ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලබන අතර, බඳවා ගැනීමේ මණ්ඩලය විසින් නිශ්චිත කරනු ලබන ලකුණු ලබාගත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට හා ශාරීරික යෝග්‍යතා ප්‍රායෝගික පරීක්ෂණයකට කැඳවීමෙන් පසුව පාඨමාලාව සඳහා තෝරා ගනු ලැබේ.

4. පාඨමාලාව පිළිබඳ විස්තර :

4.1 විෂය නිර්දේශය පහත පරිදි කොටස් 05 කින් සමන්විත වේ.

(අ) *පුහුණුවීමේ සාමාන්‍ය සිද්ධාන්ත*
ශාරීරික ගුණාංග හා හැකියාවන්, තාක්ෂණ ක්‍රම, උපාය මාර්ග, පුහුණු වීම් ක්‍රම, සැලසුම්

ක්‍රම භාරය හා පරීක්ෂණ පිළිබඳ මූලධර්ම සහ වාචික පරීක්ෂණයකින් සමන්විත වේ.

(*ආ*) අවම වශයෙන් ක්‍රීඩා 10 ක් පිළිබඳ න්‍යායික හා ප්‍රායෝගික දැනුම

(*ඇ*) ජවන හා පිටිය මළල ක්‍රීඩා පිළිබඳ විශේෂඥතාවය

(*ඈ*) ජවන හා පිටිය මළල ක්‍රීඩාවලට අමතරව ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලා කාලය තුළ කාන්තා හෝ පිරිමි අය සඳහා අවස්ථානෝචිත පරිදි තෝරා ගන්නා ලද එක් ක්‍රීඩාවක් පිළිබඳ විශේෂඥතාවය.

(*ඉ*) ක්‍රීඩා කායික විද්‍යාව, ක්‍රීඩා සමාජ විද්‍යාව, ක්‍රීඩා පරිපාලන, ක්‍රීඩා සංඛ්‍යානය, ක්‍රීඩා උත්සව සංවිධාන ක්‍රම, ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව, ක්‍රීඩා ජීව රසායන විද්‍යාව, ක්‍රීඩා පෝෂණය සහ ක්‍රීඩා මනෝවිද්‍යාව වැනි පොදු විෂයයන් පිළිබඳ දැනුම.

4.2 පාඨමාලාවේ කාලසීමාව මාස 12 කි.

4.3 මෙම පාඨමාලාව සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන් පමණක් රු. 60,000.00ක මුදලක්, ලදුපතේ ගිණුම් හිමියාගේ නම ලෙස **''ලේකම්, ක්‍රීඩා සහ යෞවන කටයුතු අමාත්‍යාංශය"** හා තැන්පතුවේ අවශ්‍යතාවය වශයෙන් "NISS DIP 26/27 ලෙස සටහන් කර අංක 7040742 දරන ලංකා බැංකුවේ ටොරිංටන් ශාඛාව වෙත පාඨමාලා ගාස්තු වශයෙන් පාඨමාලාව ආරම්භ කිරීමට පෙර ගෙවා එම ලදුපතේ ඡායාරූපයක් diploma@niss.gov.lk යන විද්‍යුත් තැපැල් ලිපිනයට එවිය යුතු අතර එසේ සිදු නොකරන්නන්ගේ මුදල් පිළිබඳව ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය වගකියනු නොලැබේ.

පාඨමාලාව සඳහා බඳවා ගනු ලබන්නේ පාඨමාලා ගාස්තු ගෙවා අවසන් කළ අපේක්ෂකයන් පමණි. එමෙන් ම මෙම මුදල වෙක්පතකින් ගෙවන්නේ නම් ආදායකයා ලෙස **''ලේකම්, ක්‍රීඩා සහ යෞවන කටයුතු අමාත්‍යාංශය"** යනුවෙන් සටහන් කළ යුතු ය. මෙම මුදල කුමන හේතුවක් නිසාවෙන් ආපසු ගෙවනු නොලැබේ.

4.4 පාඨමාලාව සඳහා සුදුසුකම් ලැබූ අපේක්ෂකයින් හට ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ නේවාසිකාගාර පහසුකම් ලබාගත හැකි අතර නේවාසිකාගාර ගාස්තුව වශයෙන් (පාඨමාලාව පවත්වනු ලබන වර්ෂයක කාල සීමාව සඳහා) රු. 18,000.00 ක මුදලක් අයකරනු ලැබේ. පාඨමාලාව සඳහා ලියාපදිංචිය සිදු කරන දින මෙම මුදල ගෙවිය යුතු වේ.

4.5 පාඨමාලා හැදෑරීම සඳහා තෝරා ගනු ලබන අය ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ නීති හා රෙගුලාසි පිළිපැදීමට බැඳී සිටිය යුතු ය.

4.6 පාඨමාලාව සාර්ථකව නිම කරන අය සඳහා **"ක්‍රීඩා ඩිප්ලෝමා"** සහතික පත්‍රය ප්‍රදානය කරනු ලබන අතර NVQ 5 වාචික පරීක්ෂණයට පෙනී සිටීමෙන් අනතුරුව NVQ 5 සහතිකය ලබා ගැනීමට අවස්තාව හිමි වනු ඇත.

5. අනෙකුත් කොන්දේසි :

5.1 පාඨමාලාව අවසානයේ දී රැකියාවක් ලබා දීමට මෙම අමාත්‍යාංශය බැඳී නැත.

5.2 පවතින ඉහළ ම සුදුසුකම් හෝ ඉල්ලා ඇති සුදුසුකම් අයදුම්පතෙහි සඳහන් කළ යුතු අතර සඳහන් කළ යුතු අතර සඳහන් නොකරන ලද දත්ත පසුව ඉදිරිපත් කළ ද භාර ගනු නොලැබේ.

5.3 මෙහි ආවරණය නොවන අනිකුත් කරුණක් වේ නම්, ඒ සම්බන්ධයෙන් ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂ සිය අභිමතය පරිදි කටයුතු කරනු ඇත.

අධ්‍යක්ෂ,
ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය.

2026 ඔක්තෝබර් මස 28 වැනි දින,
100/7, නිදහස් මාවත,
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත

ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව - 2026/2027

ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය

පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූපයක්

1.0 i. සම්පූර්ණ නම : ..... මයා/මිය/මෙනවිය

ii. මුලකුරු සමග නම :.....
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :.....

iii. සම්පූර්ණ නම :
(ඉංග්‍රීසි භාෂාවෙන් කැපිටල් අකුරෙන්)

iv. ජාතික හැඳුනුම්පත් අංකය :

2.0 ලිපිනය : .....

i. පෞද්ගලික :.....

ii. රාජකාරි :

iii. Whatsapp අංකය : .....

iv. විද්‍යුත් තැපැල් ලිපිනය (email address) : .....

v. දුරකතන අංකය (පෞද්ගලික) : ..... දුරකතන අංකය (රාජකාරි) :.....

3.0

i. උපන් දිනය: වර්ෂය : මාසය : දිනය :

ii. 2026.12.01 වැනි දිනට වයස: අවුරුදු : මාස : දින :

4.0

i. ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? නැති ද? යන වග :-

ii. පුරවැසියෙක් නම්, ලියාපදිංචි වීමෙන් ද? පරම්පරාවෙන් ද? යන වග :

5.0

i. ස්ත්‍රී / පුරුෂ භාවය :- .....

ii. විවාහක/ අවිවාහක බව :- .....

6.0 **ඔබ රැකියාවක් කරයි ද? නොකරයි ද? යන වග :** .....
තනතුර : .....
සේවා කාලය : .....
සේවා ස්ථානය : .....

07. i. **අධ්‍යාපන සුදුසුකම් :- අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය**

වර්ෂය - | | | | | විභාග අංකය - .....

විෂයය	*සාමාර්ථය*	*විෂයය*	*සාමාර්ථය*

ii. **අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය**

වර්ෂය - | | | | | විභාග අංකය - .....

විෂයය	*සාමාර්ථය*

iii. **අනෙකුත් අධ්‍යාපන සුදුසුකම් : (උසස් විභාග/ උපාධි)**

වර්ෂය - | | | | | විභාග අංකය - .....

විෂයය	*සාමාර්ථය*

08. ක්‍රීඩා දක්ෂතාවයන් (ලබා ඇති ඉහළම ක්‍රීඩා සහතික හා විදේශ දස්කම් පිළිබඳ මෙහි සඳහන් කරන්න. සියලු ම සහතිකපත්වල ඡායා පිටපත් අමුණා එවන්න.)

1. ජාතික මහා ක්‍රීඩා උළෙලේ දක්ෂතා දිස්ත්‍රික් / පළාත්/ ජාතික
.....
.....

2. ජාතික සංගම් මගින් පවත්වනු ලබන ජාතික තරගවල දක්ෂතා
.....
.....

3. ජාත්‍යන්තර තරග සඳහා සහභාගීත්වය සහ දක්ෂතා
.....
.....

09. i. *ගැසට් නිවේදනයේ* 1.1 ඡේදයේ දක්වා ඇති කුමන ඡේදය යටතේ ඉල්ලුම් කරන්නේ ද යන්න දක්වන්න.

අ	ආ	ඇ	ඈ	ඉ

ii. ඉහත දක්වා ඇති එම ඡේදයේ විස්තර වී ඇති පරිදි ලබා ඇති සුදුසුකම් පිළිබඳ විස්තර
.....
.....

10. වෙනත් කරුණු :
.....
.....

11. මෙම පාඨමාලාවට තෝරාගනු ලැබුවහොත් රු. 60,000ක මුදලක්, පාඨමාලා ගාස්තු වශයෙන් ගෙවීමට ඔබ සූදානම් ද, යන වග :
.....

මෙහි ඉහත මා විසින් දක්වා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මම සහතික කරමි. මෙම තොරතුරු අසත්‍ය බව යම්කිසි අයුරකින් සොයාගනු ලැබුවහොත් මෙම පාඨමාලාව හැදෑරීමට නුසුදුස්සෙකු වන බව හා පුහුණු පාඨමාලාවෙන් ඉවත් කරනු ලබන බව මම දනිමි.

දිනය : ....,
අයදුම්කරුගේ අත්සන.

රජයේ, පළාත් පාලන සේවයේ හා සංස්ථා සේවයේ නියුක්ත වූවන් සඳහා පමණි.

අධ්‍යක්ෂ,
ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය.

මෙම ..... සේවය කරන ..... වන .....
..... මහතා/ මහත්මිය/ මෙනවියගේ අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරන අතර, මෙම අයදුම්කරු ඉහත පාඨමාලාව සඳහා තෝරාගනු ලැබුවහොත් පාඨමාලා කාලය සඳහා ඔහුව/ඇයව සේවයෙන් නිදහස් කළ හැකි බවට සහතික කරමි.

.....
සහතික කරන නිලධාරියාගේ අත්සන
නිල මුද්‍රාව.

දිනය : ..... නම : .....
තනතුර : .....

ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සැහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.

සැළකිය යුතුයි. - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

උපලේඛනය

මාසය	*පළ කිරීමේ දිනය*		*ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව*			
			2026 වර්ෂය			
නොවැම්බර්	2026.11.06	සිකුරාදා	2026.10.23	සිකුරාදා	දහවල්	12.00
	2026.11.13	සිකුරාදා	2026.10.30	සිකුරාදා	දහවල්	12.00
	2026.11.20	සිකුරාදා	2026.11.06	සිකුරාදා	දහවල්	12.00
	2026.11.27	සිකුරාදා	2026.11.13	සිකුරාදා	දහවල්	12.00
දෙසැම්බර්	2026.12.04	සිකුරාදා	2026.11.20	සිකුරාදා	දහවල්	12.00
	2026.12.11	සිකුරාදා	2026.11.27	සිකුරාදා	දහවල්	12.00
	2026.12.18	සිකුරාදා	2026.12.04	සිකුරාදා	දහවල්	12.00
	2026.12.24	බ්‍රහස්පතින්දා	2026.12.11	සිකුරාදා	දහවල්	12.00
			2027 වර්ෂය			
ජනවාරි	2027.01.01	සිකුරාදා	2026.12.18	සිකුරාදා	දහවල්	12.00
	2027.01.08	සිකුරාදා	2026.12.24	බ්‍රහස්පතින්දා	දහවල්	12.00
	2027.01.14	බ්‍රහස්පතින්දා	2027.01.01	සිකුරාදා	දහවල්	12.00
	2027.01.21	බ්‍රහස්පතින්දා	2027.01.08	සිකුරාදා	දහවල්	12.00
	2027.01.29	සිකුරාදා	2027.01.14	බ්‍රහස්පතින්දා	දහවල්	12.00

ප්‍රසන්න ජයරත්න,
රජයේ මුද්‍රණාලයාධිපති.

2026 අප්‍රේල් මස 02 දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.